ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය

இலங்கை இறப்பர் ஆராய்ச்சி நிறுவனம்

RUBBER RESEARCH INSTITUTE OF SRI LANKA



2020

Annual Report ஆண்டறிக்கை වාර්ෂික වාර්තාව

ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය
ඩාර්ටන්ෆීල්ඩ්, අගලවත්ත

දැක්ම

රබර් කර්මාන්තය වෙත උසස් ගුණාත්මක භාවයෙන් යුත් විද්‍යාත්මක තාක්ෂණික ක්‍රම සපයා දෙන විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානය බවට පත් වීම ආයතනයේ දැක්ම වේ.

මෙහෙවර

ආර්ථික වශයෙන් ඵලදායක මෙන්ම පාරිසරක වශයෙන් හිතකාමී තිරසාර නවෝත්පාදන වැඩිදියුණු කිරීම මගින් ද, රබර් කර්මාන්තයේ පාර්ශ්වකරුවන් වෙත පුහුණු කිරීම් හා උපදේශන සේවා තුළින් නවතම තාක්ෂණික ක්‍රම හඳුන්වා දීම මගින් ද රබර් කර්මාන්ත අංශයට පුනර්ජීවයක් ලබා දීම ආයතනයේ මෙහෙවර වේ.

අරමුණු

- ජාතික ඵලදායිතාව අන්තර්ජාතික මට්ටමට උසස් කිරීම.
- ඉහළ යන ඉල්ලුමට සරිලන පරිදි දේශීය ස්වභාවික රබර් නිෂ්පාදනය නඟා සිටුවීම.
- භූමිය, ශ්‍රමය හා අනෙකුත් සම්පත් ප්‍රශස්ත මට්ටමින් තිරසාරව භාවිත කිරීම.
- රබර් සඳහා දේශීය මට්ටමින් වටිනාකම් එකතු කිරීම උපරිම මට්ටමින් සිදු කිරීම.
- පුද්ගල නිපුණතා සංවර්ධනය මෙන්ම රබර් පර්යේෂණායතනයේ සේවක පිරිස්වල ස්වයං සංවර්ධනය දිරිගැන්වීම මගින් ආයතනයේ සංවිධානාත්මක ඵලදායිතාවය වැඩි දියුණු කිරීම.

ප්‍රතිපත්ති

- රබර් නිෂ්පාදනය සහ පිරිසැකසීම සම්බන්ධ සෑම අංශයකම පර්යේෂණ හා ව්‍යාප්ති සේවා අඛණ්ඩව පවත්වාගෙන යෑම.
- පරිසර හිතකාමී හා තිරසාර කෘෂිකර්මාන්තයක් ප්‍රවර්ධනය කිරීම අඛණ්ඩව සිදු කිරීම.
- පුහුණු කිරීම් හා උපදේශන සේවා තුළින් වැඩිදියුණු කළ තාක්ෂණික ක්‍රම රබර් කර්මාන්තයේ පාර්ශ්වකරුවන්ට හඳුන්වා දීම.

අප ගැන

ශ්‍රී ලංකාවේ රබර් පර්යේෂණවල මූලාරම්භය කළුතර දිස්ත්‍රික්කයේ වැවිලිකරුවන් කණ්ඩායමක් රබර් ක්ෂීරය කැටි ගැසීම පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා රසායනඥයකුගේ සේවය ලබා ගත් 1909 වසර දක්වා විහිදී යයි. 1913 වසරේදී රබර් පර්යේෂණ යෝජනා ක්‍රමයක් ස්ථාපනය කිරීම සඳහා රබර් පර්යේෂණ සිදු කිරීම පසුකාලීනව තවදුරටත් ව්‍යාප්ත කරන ලද අතර 1951 දී මෙම ආයතනය ලංකා (වර්තමානයේ ශ්‍රී ලංකා) රබර් පර්යේෂණායතනය ලෙස හඳුන්වන ලදී. මේ අනුව, ලෝකයේ රබර් පිළිබඳව පෞරාණිකම පර්යේෂණායතනය බවට ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය (RRISL) පත් ව තිබේ. පැළැටි අභිජනනය, කෘෂිකාර්මික කළමනාකරණ පරිචයන් හා දළ රබර් රසායනය ආදී ක්ෂේත්‍රවලින් රබර් පර්යේෂණ ක්ෂේත්‍රය සඳහා ප්‍රෞඪ සේවාවක් සිදු කිරීම පිළිබඳව රබර් පර්යේෂණායතනය (RRISL) වාර්තා ගත වී තිබේ. රබර් කර්මාන්තයේ ප්‍රතිලාභය උදෙසා රබර් වගාවේ හා රබර් පිරිසැකසුම්කරණයේ සියළු අංශ පිළිබඳව පර්යේෂණ සිදු කිරීමේ හා සංවර්ධනය කිරීමේ ව්‍යවස්ථාපිත පරිපාලන වගකීම පැවරී ඇති ශ්‍රී ලංකා නියෝජිතායතනය වන්නේ ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයයි. බෝගයේ ජීව විද්‍යාව හා ස්වභාවික රබර්වල රසායනය හා නිෂ්පාදන තාක්ෂණය යන අංශ දෙකම සම්බන්ධයෙන් රබර් ආශ්‍රිත පර්යේෂණ සිදු කිරීම සඳහා මෙම ආයතනය විශේෂීකරණය වී තිබේ. තවද, තාක්ෂණ හුවමාරු ක්‍රියාකාරකම් හා ව්‍යාප්ති නිලධාරීන් හා අනෙකුත් පාර්ශ්වකරුවන් සඳහා සුදුසුකම් ලබාදීම සම්බන්ධයෙන් ද මෙම ආයතනය කැප වී කටයුතු කරයි. ඒ අනුව, මෙම පර්යේෂණාතයතනය සතුව පෙව විද්‍යාත්මක පර්යේෂණ දෙපාර්තමේන්තු 5 ක් පවතී. ශාක විද්‍යා දෙපාර්තමේන්තුව, ප්‍රවේණි හා ශාක අභිජනනය, ශාක ව්‍යාධිවේද හා ක්ෂුද්‍රජීව විද්‍යා, පාංශු සහ ශාක පෝෂ්‍යත්ව දෙපාර්තමේන්තු හා පෙව රසායන හා ශාක කායික විද්‍යා යන පෙව විද්‍යාත්මක දෙපාර්තමේන්තු පහ ද, දළ රබර් සැකසුම් සංවර්ධන හා රසායනික ඉංජිනේරු, දළ රබර් හා රසායන විශ්ලේෂණ, බහු අවයවික රසායන දෙපාර්තමේන්තුව හා දළ රබර් තාක්ෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව යන රසායනික දෙපාර්තමේන්තු ද තාක්ෂණය හුවමාරු කිරීම් සඳහා වන උපදේශන සේවා දෙපාර්තමේන්තුව සහ උපයෝගිතා පර්යේෂණ, ජෙවමිතික, කෘෂි ආර්ථික, ශ්‍රව්‍ය දෘශ්‍ය හා තොරතුරු තාක්ෂණ හා පුස්තකාල යන ඒකකවලින් ද මෙම පර්යේෂණායතනය සමන්විත වේ.



ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලය
වාර්ෂික වාර්තාව 2020

පටුන

අධ්‍යක්ෂතුමාගේ වාර්තාව	1
සංවිධාන ව්‍යුහය	5
ප්‍රධාන පෙළේ ජයග්‍රහණ	6
පර්යේෂණ දෙපාර්තමේන්තුවල ක්‍රියාකාරකම්	8
කළමනාකරණ මණ්ඩලය, කමිටු සහ කාර්ය මණ්ඩලය	19
මූල්‍ය ප්‍රකාශන	32
විගණකාධිපතිවරයාගේ වාර්තාව	89

පිටකවරය : නව පත්‍ර වැටීමේ රෝගය පාලනය කිරීම සඳහා දිලීර නාශක යෙදීම

අධ්‍යක්ෂතුමාගේ වාර්තාව
ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය

මෙම සමාලෝචනය මගින් දේශීය සහ ජාත්‍යන්තර රබර් කර්මාන්තයේ ස්වභාවය සහ රබර් කර්මාන්තය සම්බන්ධ වර්තමාන ගැටළු සඳහා විසඳුම් ලබාදීමට ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය මගින් සිදු කරනු ලබන පර්යේෂණ සහ සංවර්ධන කටයුතු ප්‍රධාන වශයෙන් උපයෝගී කර ගත හැකි ආකාරය පිළිබඳව දළ විග්‍රහයනක් සපයයි. එක් එක් අංශය මඟින් සිදු කරනු ලබන පර්යේෂණ ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර අදාළ අංශය යටතේ සඳහන් කර ඇත. පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම් සම්බන්ධ ප්‍රධාන බාධක ද ඉතා කෙටියෙන් මෙහි දක්වා ඇති අතර පරිපාලන සහ මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් ක්‍රියාත්මක කර ඇති වැඩිදියුණු කිරීම් ද මෙම වාර්තාවේ ඉදිරිපත් කර ඇත.

ශ්‍රී ලංකාවේ රබර් කර්මාන්තය
රබර් නිෂ්පාදනය සහ පරිභෝජනය

වර්ෂ 2021 මාර්තු සිට ජුනි කාල වකවානුව තුලදී ශ්‍රී ලාංකීය රබර් කර්මාන්තය රට තුල පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් සීඝ්‍ර පසුබෑමකට ලක්විය. එම කාලය තුල පෙර වසරේ මාසික අස්වැන්නෙහි සාමාන්‍යයට සාපේක්ෂව සාමාන්‍ය මාසික රබර් අස්වැන්න මෙ.ටොන් 6141 දක්වා 1.3% ක පහත වැටීමක් පෙන්විය. මෙම අස්වැන්නෙහි අඩුවීම වර්ෂ 2019 හි සමාන කාලය හා සැසඳීමේ දී මෙ.ටොන් 3400 ක අඩුවීමක් හෙවත් 12% පහත වැටීමකි. කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් රට වසා දැමීම හේතු කොට ගෙන බොහොමයක් රබර් ආශ්‍රිත කර්මාන්ත වල නිෂ්පාදන කටයුතු නැවතීම මෙම කාලය තුලදී පෙන්නුම් කෙරිණි. එසේ වුව ද කොරෝනා වසංගත තත්ත්වය තුල වුව ද රබර් ආශ්‍රිත නිෂ්පාදන කටයුතු සඳහා රජය මගින් පහසුකම් සැපයීමත් සමඟ මෙම තත්ත්වය ක්‍රමයෙන් යථා තත්වයට පත්විණි. වර්ෂ 2020 අවසානයේදී රටෙහි සමස්ත රබර් නිෂ්පාදනය මෙ.ටොන් 78,204 ලෙස වාර්තා වූ අතර, එය පෙර වසරට සාපේක්ෂව 4.6% ක වර්ධනයකි. එසේම ලෝක ආර්ථිකය මන්දගාමී බව හමුවේ වුව ද වර්ෂ 2020 අවසානයේදී රබර් පාරිභෝජනය මෙ.ටොන් 111,000 ලෙස පැවති අතර එය පෙර වසරට සාපේක්ෂව 1.7% ක සුළු පහත වැටීමකි.

රබර් වගා ප්‍රමාණය

රට තුල රබර් වගා කරන ලද සමස්ත ඉඩම් ප්‍රමාණය වර්ෂ 2020 අවසානය වන විට හෙක්ටයාර 138,300 සහ එම භූමි ප්‍රමාණයෙන් 75-80% ක් පමණ අස්වැන්න ලබා ගන්නා තත්වයෙන් පැවතිණි. මෙය පෙර වසරට සාපේක්ෂව සුළු වැඩිවීමකි.

ස්වභාවික රබර් අපනයනය

වර්ෂ 2020 අවසානය වන විට ශ්‍රී ලංකාව ස්වභාවික රබර් මෙ.ටොන් 15,766 ක් අපනයනට කොට ඇති අතර එම සංඛ්‍යාවෙන් 44% ක්‍රේප් රබර් හා 27% ෂීට් රබර් ද වේ. මෙය අපනයනය වර්ෂ 2019 සමඟ සැසඳීමේ දී 21% ක ඉහල යෑමක් පෙන්නුම් කරයි. ලෝක

වෙළඳපොළෙහි පැවති ඉහල මිල ගණන් හා පාරිභෝජනය ඉහලයාම අපනයන ඉහලයාම සඳහා ධනාත්මකව බලපා ඇත.

රබර් නිෂ්පාදන අංශය

වසර 2020 දී අමු රබර් අපනයනය තුලින් ශ්‍රී ලංකාව රු.බිලියන 5.6 ක් අත්කර ගෙන ඇති අතර එය වසර 2019 දී රු.බිලියන 4.3 කි. රබර් නිමි භාණ්ඩ අපනයන ආදායම ද වසර 2020 දී රු.බිලියන 145 කින් ඉහල ගියද, එය පෙර වර්ෂයට වඩා 5.8% පහත අගයකි. එම වසරේදී රබර් අර්ධ නිමි භාණ්ඩ ආදායම රු.බිලියන 0.53 ක් වූ අතර, එම අගය වසර 2019 දී රු.බිලියන 0.7 කි. මේ අනුව සමස්ත ශ්‍රී ලාංකික රබර් අපනයන ආදායම වසර 2020 දී රු.බිලියන 151 (ඇ.ඩො.මිලියන 816) වූ අතර එය පසුගිය වසරට සාපේක්ෂව 5.6 ක පහල යාමකි.

ගෝලීය රබර් කර්මාන්තය පිළිබඳ සමාලෝචනය

ස්වභාවික රබර් සැපයුම

වසර 2020 දී ලෝක ස්වභාවික රබර් සැපයුම දහස් ටොන් 12,782 වූ අතර එය 2019 දහස් ටොන් 13,841 කි. මෙය ස්වභාවික රබර් නිපදවන්නන්ගේ සංගමයේ සංඛ්‍යාලේඛන වලට අනුව 7.6 % ක පහත යාමකි. මෙකී කාලය තුල ආසියානු පැසිපික් කලාපයෙහි වෙළඳ පොළවල් සඳහා පැවති කොරෝනා වසංගත තත්ත්වයෙහි බලපෑම මෙයට ප්‍රධාන හේතුව විය.

ස්වභාවික රබර් ඵලදාවේ සාමාන්‍යය

කාම්බෝජය හැරුණු විට ස්වභාවික රබර් නිපදවන්නන්ගේ සංගමයට අයත් ශ්‍රී ලංකාව ඇතුළු සියලු රටවල වාර්ෂික සාමාන්‍ය අස්වැන්න පහත වැටිණි. සමස්තයක් ලෙස පරිණත වගා ඉඩම් හි වපසරිය වර්ධනය වීම වර්ෂ 2005-2012 කාලය තුල පැවති නව වගාවන්හි ව්‍යාප්තිය හේතු වී තිබේ. ශ්‍රී ලංකාවේ වාර්ෂික සාමාන්‍ය අස්වැන්න වසර 2020 දී වසරකට හෙක්ටයාරයට කි.ග්‍රෑ. 642 වූ අතර එය වසර 2019 දී වසරකට හෙක්ටයාරයට කි.ග්‍රෑ. 658 වුණි.

ස්වභාවික රබර් සඳහා පවතින ගෝලීය ඉල්ලුම

ලෝක වෙළඳපොළෙහි ස්වාභාවික රබර් සඳහා ඉල්ලුම වසර 2020 දී මෙ.ටොන් 12,827 ක් වූ අතර එය පෙර වසරට සාපේක්ෂව 6.3% ක පහත වැටීමකි.

ලෝක ස්වභාවික රබර් මිල සංචලනය

ලෝක වෙළඳපොළෙහි ස්වාභාවික රබර් සඳහා වන මිල ගණන් වසර 2019 ට සාපේක්ෂව 2020 දී සුළු ඉහල යාමක් පෙන්නුම් කෙරිණි. එය වසර 2020 පුරාවටම ඉහල අගයක පැවති අතර, ශ්‍රී ලාංකීය වෙළඳපොළෙහි III වන ශ්‍රේණියේ ෂීට් රබර් කිලෝවක මිල වසර 2019 දී ඇ.ඩො.1.86 විය. එය වසර 2020 දී ද නොවෙනස්ව පැවතිණි. තායිලන්ත වෙළඳ පොළෙහි III වන ශ්‍රේණියේ ෂීට් රබර් කිලෝවක මිල වසර 2019 දී ඇ.ඩො.1.66 ක් වූ අතර, එය වසර 2020 දී ඇ.ඩො.1.82 දක්වා පහත වැටිණි. ලෝක ස්වාභාවික රබර්

නිපදවන්නන්ගේ සංගමයේ පුරෝකථන වලට අනුව ලෝක රබර් වෙළඳපොළ මිල ගණන් තවදුරටත් වර්ධනයක් පෙන්නුම් කරනු ඇති අතර එය ලෝක ආර්ථික යහපැවැත්ම සහ ප්‍රධාන පාරිභෝජකයන්ගේත් ඉල්ලුම ඉහල යාම මත රඳා පවතිනු ඇත.

පර්යේෂණ සහ සංවර්ධනය සඳහා යොමුවීම

COVID වසංගතය මධ්‍යයේ, රටේ තෙත් ප්‍රදේශවල රබර් ඉඩම්වල 'Pestalotiopsis' නමින් නව පත්‍ර රෝගයක් ව්‍යාප්ත විය. එබැවින් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව, තුරුසවිය සහ ප්‍රාදේශීය වැවිලි සමාගම්වල සහාය ඇතිව පාලන ක්‍රමවේද වැඩි දියුණු කිරීමටත් ඒවා ක්ෂේත්‍රයේ භාවිතයටත් ප්‍රමුඛස්ථානය දෙන ලදී. එසේම සුදු මුල් රෝගය පාලනය කිරීමට රබර් වගාකරුවන්ට සහය විය. රබර් මිල අසතුටුදායක මට්ටමක පැවතීම, අධික නිෂ්පාදන පිරිවැය, රබර් වගාව සඳහා පුහුණු ශ්‍රමිකයින් නොමැතිකම, රබර් ඉඩම්වල අඩු ඵලදායිතාව සහ රටේ රබර් නිෂ්පාදනයේ අඩුවීම යන කරුණු පර්යේෂණ හා සංවර්ධන (R&D) ක්‍රියාකාරකම්වල අවධානයට ලක් විය. නිසි අයුරින් කිරි කැපීම තුළින් ඉඩම් ඵලදායිතාවය ඉහළ නැංවීමේ අරමුණින්, අස්වැන්න නෙළන්නන්ගේ ආදායම සහ ගස් ආයු කාලය වැඩි කරන අතරම නිෂ්පාදන පිරිවැය අඩු කරන අඩු සංඛ්‍යාත අස්වනු නෙලීමේ ක්‍රම, වෙනත් යහපත් කෘෂිකාර්මික භාවිතයන් සමඟ ප්‍රවර්ධනය කරන ලදී. මේ සඳහා දේශීයව Ethephon සංයෝග සකස් කරන ලදී. වඩා හොඳ ක්ෂේත්‍ර ස්ථාපිත කිරීම සඳහා නව රෝපණ ශිල්පීය ක්‍රම, පොහොර භාවිතයේ කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා සෙමින් නිකුත් කරන පොහොර, පහසු වල් පැල කළමනාකරණ පද්ධතිය සහ රබර් ඉඩම්වල සමස්ත ආදායම ඉහළ නැංවීම සඳහා රබර් සඳහා ඉහළ වටිනාකමක් ඇති නව අතුරු බෝග පිළිබඳ පර්යේෂණ අඛණ්ඩව සිදු විය. තවද, ඉහළ අස්වැන්නක්, රෝගවලට ඔරොත්තු දීම, දැව නිෂ්පාදනය සහ නියඟ ප්‍රතිරෝධය යන දිශාවන් ඔස්සේ ක්ලෝන සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරන ලදී. රබර් වගාව සඳහා වන භූමි ප්‍රමාණය වැඩි කිරීම සැලකිල්ලට ගනිමින්, සම්ප්‍රදායික නොවන ප්‍රදේශවල රබර් වගාව ව්‍යාප්ත කිරීමට අවධානය යොමු කරන ලදී. එසේම, අම්පාර සහ මොණරාගල දිස්ත්‍රික්කවල වගා කරන රබර් උපයෝගී කර ගනිමින් ස්වේච්ඡා කාබන් වෙළඳපොළ සඳහා කාබන් වෙළෙඳ ව්‍යාපෘතියක් සංවර්ධනය කිරීමට ආයතනය අවධානය යොමු කළේය. මීට අමතරව, අගය එකතු කිරීම සඳහා නව ක්‍රම ඇති කිරීම සහ සෞඛ්‍ය සම්පන්න සහ පරිසර හිතකාමී ලෙස අමු රබර් සැකසීම ඉහළ ප්‍රමුඛතාවයක් විය. රබර් භාණ්ඩ නිෂ්පාදන කර්මාන්ත සඳහා නව රබර් සංයෝග සකස් කිරීම, අඩු ප්‍රෝටීන් කේන්ද්‍රාපසාරී රබර් කිරි නිෂ්පාදනය සඳහා නව ප්‍රවේශය, රබර් භාණ්ඩ නිෂ්පාදනයේදී ස්වභාවික පාදක ආකලන සහ අමු රබර් නිෂ්පාදනයේදී ආරක්ෂිත රසායනික ද්‍රව්‍ය භාවිතය පිළිබඳ පර්යේෂණ අඛණ්ඩව සිදු විය. තාක්ෂණ හුවමාරු වැඩසටහන් ප්‍රධාන වශයෙන් වඩාත් උපාය මාර්ගික ආකාරයෙන් පවත්වන ලදී.

පුද්ගලික පොදු හවුල් ව්‍යාපාරයක් ලෙස කළමනාකරණය කරන පරිමිත මූලද්‍රව්‍ය විශ්ලේෂණ සහ අනුකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම් දිගටම සිදුකල අතර, ආයතනයේ ටයර් පරීක්ෂා කිරීමේ පහසුකම ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය ප්‍රධාන උපකරණ මිලදී ගැනීම සඳහා කටයුතු කරන ලදී.

පර්යේෂණ සඳහා පවතින බාධක

ආයතනයට ප්‍රමාණවත් මුදල් වෙන් කර තිබියදීත්, සුදුසුකම් ලත් ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයින් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති වීමේ ප්‍රශ්නය දිගටම පැවතුනි. එවැනි ඉහළ මට්ටමේ තනතුරු සඳහා ක්‍රියාත්මක වන ආකර්ශනීය නොවන වැටුප් පැකේජ හේතුවෙන් පර්යේෂකයින්, විශේෂයෙන් දේශීය විශ්වවිද්‍යාලවල සේවය සඳහා ඉවත් වී යාමක් සිදුව ඇත. විසඳුමක් ලෙස සියලුම වැවිලි භෝග පර්යේෂණ ආයතන ඒකාබද්ධ කර විශ්වවිද්‍යාලයක් ගොඩනැගීමේ යෝජනාවක් සාකච්ඡා වෙමින් පවතී. රබර් කර්මාන්තයේ වේගවත් සංවර්ධන වේගයක් රට අපේක්ෂා කරන බැවින් මේ සඳහා ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ කඩිනම් අවධානය අවශ්‍ය වේ.

පරිපාලන සහ මූල්‍ය කටයුතු

රට වසා දැමීමේ කාලය තුළ පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම්වල ප්‍රගතිය බලපෑවද, වසර අවසන් වන විට භෞතික හා මූල්‍ය අංශයන්හි සාමාන්‍ය කාර්ය සාධනය සතුටුදායක මට්ටමක පැවතුණි. සේවකයින්ට ලබා දෙන පුහුණු වැඩසටහන් රට තුළ 15 කට සීමා විය. විදේශ සංචාරවල කිසිදු සිදුවීමක් වාර්තා නොවූ නමුත් ඩිජිටල් වේදිකාවේ දේශීය හා ජාත්‍යන්තර වැඩසටහන් කිහිපයකට පර්යේෂකයන් සහභාගී විය.

ඇගයීම

පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඵලදායීව ඉටු කිරීම සඳහා රබර් පර්යේෂණ මණ්ඩලය සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මඟින් මූල්‍ය සහාය සහ අනුග්‍රහකත්වය සමඟ ලබා දෙන ලද මාර්ගෝපදේශන සහ උපදෙස් අතිශයින්ම අගය කරමි. පර්යේෂණ සහ සංවර්ධන කටයුතු ඉටු කිරීමේදී අනෙකුත් පාර්ශ්වකරුවන් විසින් ලබා දුන් සහාය ද ගෞරවයෙන් සිහිපත් කරමි. වාර්ෂික වාර්තාව පිළියෙල කිරීම සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්, විද්‍යාත්මක සහ විද්‍යාත්මක නොවන අංශවල සියලුම අංශ ප්‍රධානීන් සහ අනෙකුත් කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් ලබා දෙන ලද දායකත්වය වෙනුවෙන් මගේ කෘතඥතාව පළ කරමි.

විශේෂයෙන්ම, මෙම සමාලෝචනය සඳහා අවශ්‍ය වන දත්ත ලබා දීම වෙනුවෙන් කෘෂි ආර්ථික ඒකකයට ද, අවශ්‍ය කරුණු සම්පාදනය කර 2020 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව එළිදැක්වීම වෙනුවෙන් පුස්තකාල සහ ප්‍රකාශන ඒකකයේ කාර්යමණ්ඩලයට ද විශේෂ ස්තුතිය පුද කරමි.



ආචාර්ය වී.එච්.එල්. රොද්‍රිගෝ
අතිරේක අධ්‍යක්ෂ

සංවිධාන ව්‍යුහය



BO	- මණ්ඩල කාර්යාලය	G & PB	- ප්‍රවේනි හා ශාක අභිජනන	PP & MB	- ශාක ව්‍යාධි හා ක්ෂුදු ජීවී
IAU	- අභ්‍යන්තර විගණන	PS	- ශාක විද්‍යා	S & PN	- පාංශු හා ශාක පෝෂ්‍යත්ව
DF/EST	- වතු දෙපාර්තමේන්තුව	BC & PP	- ජෛව රසායන හා ශාක කායික විද්‍යා	ASD	- උපදේශක සේවා
ARU	- උපයෝගිතා පර්යේෂණ	RRPD & CE	- දළ රබර් සැක. සංව.හා රසා. ඉංජි	RR&CA	- දළ රබර් හා රසායන විශ්ලේෂණ
LIB	- පුස්තකාලය	PC	- බහු අවයවික රසායන	RTD	- රබර් තාක්ෂණික හා සංවර්ධන
AV & IT	- ශ්‍රව්‍ය දෘශ්‍ය තොරතුරු තාක්	BM	- ජෛවමිතික BO - මණ්ඩල කාර්යාලය	AEU	- කෘෂි ආර්ථික විද්‍යා
WS	- වැඩ අංශය	ADM	- පාලන DO - අධ්‍යක්ෂ කාර්යාලය	ACC	- මූල්‍ය

2020 වර්ෂය තුළ ලබා ගත් ප්‍රධාන ජයග්‍රහණ

- නව වාණිජව යොදාගත හැකි ඊතෝන් සංයුති දෙකක් (ජලය හා තෙල්වල ද්‍රාව්‍ය) දේශීයව නිපදවන ලදි.



- සාම්ප්‍රදායානුකූල පොහොර යෙදීම හා සැසඳීමේදී සෙමින් පෝෂක මුදාහරින නැවත නැවතත් භාවිත කළ හැකි සිදුරුමය පොහොර නලය භාවිතය මගින් ශාකයේ වර්ධනයේ කැපී පෙනෙන වැඩිවීමක් (20%) දක්නට ලැබුණු අතර පාංශු පෝෂක වන මැග්නීසියම් හා පත්‍ර වල පවතින නයිට්‍රජන් හා මැග්නීසියම්හි ද වැඩි වීමක් අධ්‍යයනය කරන ලදී.
- සපත්තු කර්මාන්තයේ නිෂ්පාදන වියදම අඩු කිරීමේ අරමුණින්, වියලි රබර් වලට අර්ධ වශයෙන් ආදේශකයක් ලෙස, පේටන්ට් බලපත්‍රලාභී පරිසර හිතකාමී ප්‍රතිචක්‍රීකරණ කාරකයක් ආධාරයෙන් නිපදවන ලද ප්‍රතිචක්‍රීකරණය කරන ලද රබර් යොදා ගනිමින් මධ්‍යම පරිමාණ රබර් හාණ්ඩ නිෂ්පාදකයකුගේ සහයෝගීතාවයෙන් අපනයනය සඳහා සපත්තු වලට අඩි නිෂ්පාදනය කරන ලදී.
- මිනිස් පරිහරණයට අහිතකර රසායනික ද්‍රව්‍යයක් ලෙස හඳුනාගත් කාබන් බිලැක් පිරවුම් කාරකය වෙනුවට සහ රබර් සංයෝග වල ගුණ වැඩි කිරීමේ අරමුණින් කොහුවලින් සංස්ලේෂණය කරන ලද ක්ෂුද්‍ර සහ නැනෝ ප්‍රමාණයේ තන්තු යොදා ගනිමින් ස්වාභාවික රබර් ආශ්‍රිත සංයෝග නිපදවන ලදී.
- Covid-19 වසංගතයෙන් ආරක්ෂා වීම සඳහා ස්වභාවික රබර් කිරි පදනම් කරගත් විලාසිතාමය අත්වැසුම් නිපදවීමේ මූලික කටයුතු සිදු කරන ලදී (රූපය 1).



රූපය 1. ස්වභාවික රබර් කිරි මත පදනම් වූ විලාසිතාමය අත්වැසුම්

- Covid-19 වසංගතයට මුහුණදීමේ අවශ්‍යතාවයක් ලෙස ව්‍යවසායකයෙකු විසින් කරන ලද ඉල්ලීමක් මත රෙදි වලින් සාදන ලද කූඩාරම් සඳහා ජල ආරක්ෂිත ආලේපන ද්‍රව්‍යයක් ලෙස ස්වභාවික රබර් කිරි ආශ්‍රිත සංයෝගයක් නිපදවන ලදී.
- මිනිස් පරිහරණයට අහිතකර රසායනික ද්‍රව්‍යයක් ලෙස හඳුනාගත් කාබන් බ්ලැක් පිරවුම් කාරකය සඳහා අර්ධ ආදේශකයක් ලෙස දුරියන් ලෙලි වල කෙඳි සහිත ස්වභාවික රබර් පදනම් වූ සංයෝග නිපදවන ලද අතර එය ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පේෂකර්ම දෙපාර්තමේන්තුවේ සහයෝගීතාවයෙන් සපත්තු අඩි නිෂ්පාදනයට යොදාගන්නා ලදී (රූපය 2).



රූපය 2. ස්වභාවික රබර් ආශ්‍රිත දුරියන් ලෙලි වල තන්තු යොදා ගනිමින් නිපදවන ලද සපත්තු අඩි

පර්යේෂණ දෙපාර්තමේන්තුවල ක්‍රියාකාරකම් - 2020

ශස්‍ය විද්‍යා දෙපාර්තමේන්තු/අංශ/ඒකක

ප්‍රවේණි සහ ශාක අභිජනන දෙපාර්තමේන්තුව

- නව ප්‍රවේනි දර්ශ 57 ක් නිපදවමින් නියුවැටෙල් වතුයායේ කෘතීම පරාගණ වැඩසටහන සිදු කරන ලදී.
- නිශ්චිත අස්වනු දර්ශක නිර්දේශ කිරීම සඳහා 2009 ECT හි ඇලදුව වතුයායේ දත්ත රැස් කරන ලදී.
- කුඩා පරිමාණ ක්ලෝන ඇගයීම සඳහා 2013 HP පරම්පරාවෙන් ප්‍රවේණි වර්ග 20 ක් තෝරා ගන්නා ලදී.
- "අතුරු ක්ලෝන නිර්දේශය" වර්ධනය කිරීම සඳහා ප්‍රවේණි වර්ග පහක් නිර්දේශ කරන ලදී.
- ඩෙල්කිත් වතුයායේ රබර් කිරි සහ දැව රබර් කිරි වර්ග යටතේ 2000 HP පරම්පරාවේ ප්‍රවේණි වර්ගවල ලක්ෂණ අධ්‍යයනය කරන ලදී.

ශාක විද්‍යා දෙපාර්තමේන්තුව

- ළපටි බද්ධ පැළ තවාන් සඳහා විවිධ බීජ ප්‍රමාණයන්ගේ බලපෑම අධ්‍යයනය කිරීම සඳහා මොනරාගල ප්‍රදේශයේ සිදුකරන ලද පර්යේෂණ පැළ වල වර්ධනය හා කායික විද්‍යාත්මක ලක්ෂණ ලෙස බීජ රෝපන අවධිය, පැළවල වර්ධනය, සාර්ථක බද්ධ පැළ ගණන ආදී දත්ත වාර්තා කරන ලදි. තවද, කැකිරාව ප්‍රදේශයේ ආරම්භ කරන ලද විශේෂිත රබර් පැළ (Super Plant) රෝපන ද්‍රව්‍ය ලෙස යොදාගෙන සිදුකරන ලද පර්යේෂණයේ දී පැළවල වර්ධනය හා කායික විද්‍යාත්මක ලක්ෂණයන්ගේ දත්ත වාර්තා කරන ලදි.
- මොනරාගල ප්‍රදේශයේ නව රබර් වගාවන් ස්ථාපනය කිරීමේදී වලවල් කැපීම සඳහා යාන්ත්‍රිකව වලවල් හාරන උපකරණයක් භාවිතා කිරීමේ හැකියාව අධ්‍යයනය කිරීම සඳහා පර්යේෂණයක් ආරම්භ කරන ලද අතර, එලෙස සංස්ථාපනය කරන ලද පැළවල වර්ධනය අත්හදා බලන ලදි.
- රබර් හා තේ යොදා ගනිමින් සිදුකරන අතුරුබෝග වගා පර්යේෂණයේ තේ හා රබර් කිරි අස්වැන්න පිළිබඳ දත්ත වාර්තා කරන ලදි.
- රබර් සමග අතුරුබෝග ලෙස සාදික්කා සහ කුරුඳු විවිධ පරතරයන්ට වගා කිරීමේ හැකියාව අධ්‍යයනය කිරීමට නව පර්යේෂණ වගාවන් පිළිවෙලින් ලබුගම හා කුරුවිට ප්‍රදේශවල සංස්ථාපනය කරන ලදි.
- මොනරාගල හා අම්පාර දිස්ත්‍රික්කවල ස්ථාපනය කර ඇති රබර් සමග පළතුරු බෝග සිටුවීමේ පර්යේෂණයන්ගේ පැළවල වර්ධනය හා කායික විද්‍යාත්මක ලක්ෂණ පිළිබඳ දත්ත වාර්තා කරන ලදි.

- වල්ලාපට්ට ශාක (Aquilaria Plants) වල රෙසීන සෑදීම උත්තේජනය කිරීම සඳහා විවිධ සාන්ද්‍රනයන්ගෙන් යුත් දිලීර රෝපිතයන් ශාක තුලට එන්නත් කරන ලද අතර, ඊට මාස 10 කට පමණ පසු එම ශාක වලින් රෙසීන නිස්සාරණය කර ගන්නා ලදි.
- කිරි කැපීම සම්බන්ධව සිදු කරන පර්යේෂණයන්ගේ රබර් කිරි අස්වැන්න, වර්ධනය සහ පොත්ත සම්බන්ධ මිනුම් වාර්තා කරන ලදි.
- පොත්ත තැම්බීමේ රෝගය (TPD) පිළියම් ලෙස ප්‍රතිඔක්සිකාරක ආලේපන කිරීම අඛණ්ඩව සිදුකරන ලදි.
- පාන්දරින් කිරි කැපීම පිළිබඳ අධ්‍යයන කිරීම සඳහා සිදුකරන පර්යේෂණයේ මාස කිහිපයක් කිරි අස්වැන්න හා කාළගුණික දත්ත සටහන් කරන ලදි.
- කිරි කැපීම සඳහා යොදා ගත හැකි නව කිරි කැපීමේ යන්ත්‍රයක මූලාකෘතියක් පරීක්ෂා කරන ලදි.
- ළපටි බද්ධ පැළ තවාන් 52 ක් සහ රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් බද්ධ අතු තවාන් අධීක්ෂණය කෙරුනු අතර, සාර්ථක ළපටි බද්ධ පැළ 466,400 ත් මෙම වර්ෂයේදී නිකුත් කිරීම සඳහා සහතික කරන ලදි.
- වගා ක්ෂේත්‍රය් හඳුනාගත් ගැටලු නිරාකරණය සඳහා උපදේශක සේවාවන් සිදුකරනු ලැබූ අතර, තවාන් පාලනය, බද්ධ කිරීම හා කිරි කැපීම සම්බන්ධ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.

ශාක ව්‍යාධි හා ක්ෂුද්‍රජීවී විද්‍යා දෙපාර්තමේන්තුව

- ද්විතියික පත්‍ර පතන රෝගය, පිටිපුස් රෝගය හා කොලිටොට්‍රිකම් පත්‍ර රෝගය ඇතිවීම මධ්‍යස්ථ මට්ටමක පවතින බව ක්ලෝන පරීක්ෂණ වැඩසටහන් මගින් පෙන්නුම් කරන ලදී. අවදානමට ලක්විය හැකි ස්ථාන කිහිපයක, රෝග වසංගත තත්ත්වයට පැමිණ ඇත.
- කොරිනස්පෝරා රෝගය පරීක්ෂා කිරීමේ වැඩසටහන මත පදනම්ව, ක්ෂේත්‍රයෙන් නව ක්ලෝන වල රෝගය වාර්තා වී නොමැත. සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවලින් කොරිනස්පෝරා පත්‍ර පතන රෝගය සාපේක්ෂව ඉහළ මට්ටමකට වාර්තා වී තිබේ.
- සුදු මුල් රෝගය ඵලදායී ලෙස කළමනාකරණය කිරීම පිළිබඳව වගාකරුවන් දැනුවත් කිරීම සඳහා පුහුණු වැඩසටහන් 10 ක් පවත්වන ලදී. නව තාක්ෂණයන්හි කාර්යක්ෂමතාවය විදහා දැක්වීම සඳහා නිර්දේශ භාවිතා කරමින් ආදර්ශ වගා දොළහක් ද ස්ථාපනය කරන ලදී.
- සුදු මුල් රෝගය ජීව විද්‍යාත්මකව පාලනය කිරීම සඳහා රබර් වගා කරන පසෙන් ප්‍රතිරෝධී දිලීර හඳුනා ගන්නා ලදී. ජෛව පළිබෝධ නාශකයක් සැකසීම සඳහා ටැල්ක් අඩු විශාල මාධ්‍යයක් ලෙස හඳුනාගෙන ඇති අතර රසායනාගාර තත්වයන් යටතේ එහි කාර්යක්ෂමතාවය ඔප්පු කර ඇත.
- අභ්‍යන්තර තත්ත්ව යටතේ සුදුමුල් රෝග කාරකයාට එරෙහිව ක්‍රියාත්මක වන ප්‍රතිවිරෝධී විවිධ ශාක ක්ෂේත්‍රයේ පරීක්ෂාවට ලක් කරන ලදී.
- *Phellinus noxius* රෝග කාරකයාගේ ජීව විද්‍යාව පිළිබඳ අධ්‍යයනයන් අවසන් කර ආචාර්ය උපාධි වැඩසටහනක් සම්පූර්ණ කර වාර්තාවක් ඉදිරිපත් කරන ලදී.

- 2019 අවසානයේ වාර්තා වූ නව පත්‍ර පතන රෝගය රබර් වගා කරන ප්‍රධාන දිස්ත්‍රික්ක සියල්ලටම තවදුරටත් ව්‍යාප්ත වන බව වාර්තා විය. 2020 අවසානය වන විට, දළ වශයෙන් හෙක්ටයාර 20,000 ක් පමණ රෝගයට ගොදුරු වී ඇති බව වාර්තා වේ. ජීව විද්‍යාව, වසංගත රෝග විද්‍යාව සහ රසායනික පාලනය ක්‍රම පිළිබඳ මූලික පරීක්ෂණ ආරම්භ කරන ලදී. රෝගය තවදුරටත් පැතිරීම සීමා කිරීම සඳහා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව සමඟ එක්ව රසායනික පාලන වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. මෙය නව රෝගී තත්ත්වයක් බැවින් වැඩිදුර පරීක්ෂණ සිදුකිරීම සඳහා අරමුදල් ලබාගැනීමට සංවර්ධන ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කෙරිණි.

පාංශු හා ශාක පෝෂ්‍යත්ව දෙපාර්තමේන්තුව

- මුකුණා ආවරණ බෝග වගාව සහිත අපරිණත රබර් වගාවන් වල වල් පැළෑටි මර්ධනයේදී පොලිතීන් ආවරණයට වඩා සෙවණ දැල් ආවරණය සැලකිය යුතු ලෙස ප්‍රතිඵලදායක බව සොයාගන්නා ලදි.
- අපරිණත රබර් පැල සඳහා සම්ප්‍රදායික පොහොර යෙදීමේ ක්‍රමයන්ට වඩා නැවත භාවිතා කළ හැකි සිදුරු සහිත පොහොර නල භාවිතයේදී අපරිණත රබර් පැල සඳහා වට ප්‍රමාණ ලබා දුනි.
- පෙස්ටලෝටීජ්සිස් රෝග ලක්ෂණ පෙන්නුම් කරන රබර් වගාවන් වල පාංශු පෝෂක ව්‍යාප්ත වී ඇති ආකාරය සලකා බැලීමේදී පෝෂක ද්‍රව්‍ය වල ආතතිය හා රෝග අතර කිසිදු සම්බන්ධතාවයක් නැති බව පෙනී යයි.
- පාංශු, කාලගුණ හා GIS මිනුම් ලකුණු ඇති ස්ථාන වල භූ ලක්ෂණ දත්ත උපයෝගී කර ගනිමින් ක්ෂේත්‍ර විශේෂිත මූලික භූමි යෝග්‍යතා තත්ව පිළිබඳ සොයා බැලීම මූලාරම්භ කිරීමට භූමි යෝග්‍යතා ආකෘතියක් වැඩි දියුණු කරන ලදි.
- සම්ප්‍රදායික නොවන රබර් වගා කරන ප්‍රදේශ වල විවිධාකාර පොහොර මිශ්‍රණ වලට සාපේක්ෂව R/SA පදනම් වූ මිශ්‍රණ වඩා ප්‍රශස්ථ වූ ශාක වර්ධනයක් පෙන්නුම් කරන ලදි.
- කොළඹ දිස්ත්‍රික්කයේ විවිධ පාංශු ශ්‍රේණි වල පාංශු, ශාක හා ක්ෂේත්‍ර පරාමිතීන් අධ්‍යනයේදී මීට පෙර අධ්‍යන වලදී පෙන්වූ අගයන්ට වඩා සැලකිය යුතු ලෙස ඉහළ අගයන්ගෙන් යුත් පාංශු පොස්පරස් සංයුතියක් පෙන්නුම් කල අතර එමඟින් යෙදිය යුතු එප්පාවල රොක් පොස්පේට් (ERP) ප්‍රමාණයෙන් අඩු කිරීමක් කල හැකි බව පෙන්වයි.
- ක්ෂේත්‍ර විශේෂිත පොහොර නිර්දේශ කිරීමේ වැඩසටහන යටතේ හෙක්ටයාර 2645 ක පරිණත රබර් වගා කරන ප්‍රදේශයක් ආවරණය කරමින් පොහොර නිර්දේශ වාර්තා 19 ක් නිකුත් කරන ලදි.
- රබර් වගාව සඳහා භූමි යෝග්‍යතා පරීක්ෂා කිරීමේ වැඩසටහන යටතේ හෙක්ටයාර 490 ක් ආවරණය කරමින් භූමි පරීක්ෂණ වාර්තා 6 ක් නිකුත් කරන ලදි.
- විශ්ලේෂණ සේවාව යටතේ පොහොර හා පාංශු සාම්පල් 171 ක් පදනම් කරගෙන විශ්ලේෂණ වාර්තා 54 ක් නිකුත් කරන ලදි.

ජෛව රසායන හා කායික විද්‍යා දෙපාර්තමේන්තුව

- S/2 d4 අඩු තීව්‍රතා කැපූ ක්‍රම පිළිබඳ තාක්ෂණික දැනුම බෙදාහැරීමේ වැඩසටහන් කළුතර, කෑගල්ල, රත්නපුර, කොළඹ, ගම්පහ, කුරුණෑගල, නුවර සහ ගාල්ල යන දිස්ත්‍රික්කවල කුඩා රබර් වතු හිමියන් 180 ක් සහ වතු සමාගම් වලට අයත් වතු 16 ක් සඳහා පැවැත්වීම. ඉහත සඳහන් දිස්ත්‍රික්කවල කුඩා රබර් වතු හිමියන් සහ වතු සමාගම් වලට අයත් වගා හෙක්ටෙයාර 200 ක ප්‍රමාණයක S/2 d4 අඩු තීව්‍රතා කැපුම් ක්‍රම සඳහා යොමු වී ඇත.
- තිරසාර රබර් කර්මාන්තයක් උදෙසා නව අඩු තීව්‍රතා කැපුම් ක්‍රම පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු තවදුරටත් ඉදිරියට කරගෙන යාම. මේ සඳහා සති අන්තයේදී කිරි කැපීමේ ක්‍රමය සහ ද්විත්ව කැපුමක් d4 තීව්‍රතාවයෙන් කැපීම පිළිබඳ පර්යේෂණ සිදුකරන ලදී.
- විවිධ කෘෂි පාරිසරික කලාප වලට වඩාත් ගැළපෙන රබර් ක්ලෝන හඳුනාගැනීම සඳහා වවුනියාව, කන්දකාඩු, හම්බෙගමුව සහ පදියතලාව යන පර්යේෂණ ක්ෂේත්‍රයන් වල ස්ථාපිත කර ඇති ක්ලෝන 10 ක කායික විද්‍යා, ජෛව රසායන හා වර්ධන ක්‍රියාකාරිත්වය පිළිබඳ අධ්‍යන කටයුතු සිදුකිරීම.
- තත්වයෙන් උසස් දළ රබර් කිරි නිපදවන වඩාත් හොඳ රබර් ක්ලෝන හඳුනා ගැනීම සඳහා රබර් කිරි වල ජෛව රසායනික කායික විද්‍යා විශ්ලේෂණ කටයුතු සිදු කිරීම.
- රබර් වගා වල ඵලදා උත්තේජකයක් ලෙස වඩාත්ම උචිත එතෆෝන් ආකාර හඳුනාගැනීම සඳහා අස්වැන්න, රබර් කිරි වල ජෛව රසායන හා කායික විද්‍යාත්මක වෙනස්වීම් සහ දළ රබර් වල ගුණාත්මක භාවය කෙරෙහි වෙළඳපලේ ඇති එතෆෝන් වර්ග වල බලපෑම් පිළිබඳ අධ්‍යනය කිරීම.
- දේශීයව නිපදවන ලද එතෆෝන් මිශ්‍රණයන් වල ඵලදායීබව පරීක්ෂා කිරීම සඳහා පර්යේෂණ පවත්වාගෙන යාම.

උපදේශක සේවා දෙපාර්තමේන්තුව

- රබර් ඉඩම් 154 ක් ආදර්ශ වගාවන් ලෙස සංවර්ධනය කරන ලදි (අපරිනත - 71, පරිනත 83).
- රබර් සැකසුම් මධ්‍යස්ථාන 21 ක් ආදර්ශ රබර් සැකසුම් මධ්‍යස්ථාන ලෙස වැඩි දියුණු කරන ලද අතර, නව දුම් ගැසූ දාර රබර් සැකසුම් මධ්‍යස්ථාන 31 ක් ඉදි කරන ලදි.
- අපේක්ෂිත මට්ටමට නිෂ්පාදන කටයුතු සිදු නොවන දුම් ගැසූ දාර රබර් සැකසුම් මධ්‍යස්ථාන 11 පුනරුත්තාපනය කිරීමේ කටයුතු සිදු කරන ලදි.
- රබර් ඉඩම් 38 ක් වැනි ආවරණ ආදර්ශන ලෙස සකස් කරන ලදි.
- රබර් ඉඩම් 07 ක් අතුරු බෝග ආදර්ශ ලෙස වැඩි දියුණු කරන ලදි.
- රබර් කිරි කපන්නන්ගේ හිඟයට විසඳුමක් ලෙස කිරි අස්වනු නෙලීම පුහුණු කිරීමේ පාසල් (TTS) මගින් නව කිරි අස්වනු නෙලීමේ සහයකයින් 29 දෙනෙකු ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

- කුඩා රබර් ඉඩම් හිමියන් අතරින් අර්ධ පුහුණු කිරි අස්වනු නෙලීමේ සහයකයින් 22 ක් ද, වතු අංශයෙන් අර්ධ පුහුණු කිරි අස්වනු නෙලීමේ සහයකයින් 523 ක් ද තාක්ෂණිකව ඉහල ගුණාත්මයකින් කිරි කැපීම පුහුණු කරන ලදි.
- සාමාන්‍ය රබර් වගාව හා රබර් පිරිසැකසුම් අංශ පිළිබඳව රබර් වගාකරුවන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් 150 ක් ද පුහුණු කරන ලදි.
- GIS තාක්ෂණය ඔස්සේ උපදේශන සහ පුහුණු වැඩසටහන් වලට අදාලව දත්ත සිතියම් ගත කිරීම සිදු කරමින් පවතී.
- මොනරාගල තාක්ෂණ උද්‍යානයේ වගා ආදර්ශන සහ ප්‍රදර්ශන භූමි වල වැඩ කටයුතු නිම කරන ලදි.
- කුඩා ඉඩම් ඒකක 71 ක් සඳහා උපදේශන සහ ව්‍යාප්ති සේවා සපයමින් විහිදුම් සත්කාර ලෙස හඳුන්වන කණ්ඩායම් ව්‍යාප්ති වැඩ සටහන් ඵලදායි අන්දමින් පවත්වන ලදි.
- කුඩා පරිමාණ රබර් වගාකරුවන් මගින් සිදු කරන ලද ඉල්ලීම මත තාක්ෂණය උපයෝගී කර ගැනීමේ දී ඇති වූ ගැටළු විසඳීම සඳහා උපදේශන චාරිකා 190 ක් සම්පූර්ණ කරන ලදි
- සම්පත්දායකයින් ලෙස,
    - තුරුසවිය අරමුදල මඟින් සංවිධානය කල ගුණාත්මක රබර් ෂීට් නිපදවීම පිළිබඳ වැඩසටහන් 6 කට සහ අස්වනු සහයකයින් පුහුණු කිරීමේ වැඩසටහන් 5 කට සහභාගීවීම.
    - රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කල කිරි කැපුම් පුහුණු පාසල් 3 කට සහභාගී වීම.
    - රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කල වැහි ආවරණ භාවිතය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනට සහභාගී වීම.

ජෛවමිතික අංශය

- ජෛවමිතික අංශය පර්යේෂණ සැලසුම් කිරීම, විශ්ලේෂණය සහ පර්යේෂණ ප්‍රතිඵල අර්ථ නිරූපණය කිරීම සඳහා අනෙකුත් පර්යේෂණ දෙපාර්තමේන්තුවලට සහාය විය.
- ඉහත කරුණු පිළිබඳ වඩා හොඳ සේවාවක් සැපයීමේ අරමුණින්, ජෛවමිතික අංශයේ පර්යේෂණ වැඩසටහන තුළ සංඛ්‍යානමය ක්‍රම සංවර්ධනය සහ සුදුසු අයුරින් වෙනස් කිරීම් සඳහා ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන ලදී.
- ඩාර්ටන්ෆීල්ඩ් හි පිහිටුවා ඇති කෘෂි කාලගුණ මධ්‍යස්ථානය (AGROMET) සහ කුරුවිට සහ මොණරාගල උප ස්ථානයන්හි පිහිටුවා ඇති කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන නඩත්තු කරන ලද අතර දත්ත සටහන් කර පර්යේෂණ කටයුතු සඳහා යොදා ගන්න ලදී.
- ඉහත සඳහන් කළ ස්ථාන වලට අමතරව නිවිතිගලකැලේ, ගලේවත්ත සහ පොල්ගහවෙල උප මධ්‍යස්ථාන වලින් වර්ෂාපතන දත්ත රැස්කර වාර්තා කරන ලදී.
- රබර් වගා කරන ප්‍රදේශවල කාලගුණික සහ දේශගුණික විපර්යාස පිළිබඳ පර්යේෂණ ජෛවමිතික අංශය මගින් සිදු කරන ලදී.

උපයෝගීතා පර්යේෂණ ඒකකය

- වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රබර් වගා කිරීම පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයක් සිදුකරන ලදී.
- මොණරාගල හා අම්පාර දිස්ත්‍රික්කයන් හි ස්ථාපනය කරන ලද නව රබර් වගා මගින් තිර කරනු ලබන කාබන් ඇස්තමේන්තු ගත කිරීම සඳහා කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය සමග ඒකාබද්ධව එම ඉඩම් සිතියම් ගත කරන ලදී.
- අම්පාර සහ මොණරාගල දිස්ත්‍රික්කවල රබර් වගාකරුවන් කාබන් වෙළඳාම සහ එහි ප්‍රතිලාභ පිළිබඳව දැනුවත් කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.
- රබර් ආශ්‍රිත රාජ්‍ය ආයතනවල කාබන් පියසටහන් ගණනය කිරීම සඳහා මූලික දත්ත රැස් කිරීම ආරම්භ කරන ලදී.
- කෑගල්ල සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල කුඩා රබර් වගා කරුවන්ගේ රබර් ඉඩම්හි ඵලදායිතාවය සහ නිෂ්පාදන විචල්‍යතාවය අධ්‍යයනය කරන ලදී.

කෘෂි ආර්ථික විද්‍යා අංශය

- රබර් කර්මාන්තයේ වර්ධන මිනුම් (වර්ධන වේගයන්, අදායම් ඉපයීම්) පිලිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යනයන් සිදුකිරීම.
- රබර් ආශ්‍රිත අතුරුභෝග නිෂ්පාදනය කරන කුඩා පරිමාණ වතු හිමියන්ගේ දරිද්‍රතාවය සහ ඒ සඳහා බලපාන සාධක පිලිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යනයක් සිදුකිරීම.
- කෑගලු දිස්ත්‍රික් කුඩා පරිමාණ රබර් ඉඩම් හිමියන්ගේ තාක්ෂණික කාර්යක්ෂමතාව පිලිබඳ අධ්‍යනයක් සිදුකිරීම.
- මොණරාගල දිස්ත්‍රික් රබර් ආශ්‍රිත අතුරුභෝග නිෂ්පාදනය කරන කුඩා පරිමාණ රබර් ඉඩම් හිමියන් වර්ගීකරණය සිදුකොට ඔවුන්ගේ වගාවන් තවත් වැඩි දියුණු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග හඳුනා ගැනීම.

පුස්තකාලය හා ප්‍රකාශන ඒකකය

- පුස්තකාලයේ විමර්ශන අංශයේ මුළු පොත් එකතුව 6208 ක් වන පරිදි තවත් පෙළ පොත් විසිහයක් ඇතුළත් කරමින් පුස්තකාලයේ විමර්ශන අංශය යාවත්කාලීන කරන ලදී.
- පුස්තකාලය සඳහා ගබඩා කාමරයක් ඉදිකර, බැඳි එකතු බොහෝ ප්‍රමාණයක් එහි තැම්පත් කරන ලදී.
- උපදෙස් පත්‍රිකා 1000 ක්, වාර්ෂික විමර්ශණ වාර්තාව 2018 සහ වාර්ෂික වාර්තාව 2019 යන ආයතනික ප්‍රකාශන කිහිපයක් සම්පාදනය කරන ලදී.

ශ්‍රව්‍ය දෘශ්‍ය හා තොරතුරු තාක්ෂණ ඒකකය

- ඩාර්ටන්ෆීල්ඩ් කාර්යාල පරිශ්‍රයේ දැනට ස්ථාපිත අධි විභේදන නිරීක්ෂණ කැමරා පද්ධතියේ කැමරා සංඛ්‍යාව 47 දක්වා වැඩි කරන ලදී. ඒ අනුව තවත් අධි විභේදන නිරීක්ෂණ කැමරා 09 ක් අවශ්‍ය ස්ථානවල සවි කර වින්‍යාසගත කරන ලදී.

- ඩාර්ටන්ෆිල්ඩ් කාර්යාල පරිශ්‍රයේ අන්තර්ජාල දත්ත වේගය වැඩි දියුණු කිරීම සඳහා අතථ්‍ය ප්‍රාදේශීය ප්‍රදේශ ජාලය (VLAN) ස්ථාපනය කර වින්‍යාසගත කරන ලදී.
- ජෛව රසායන සහ කායික විද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රතිසංස්කරණය කරන ලද ප්‍රදේශය සඳහා පරිගණක ජාල/අන්තර්ජාල පහසුකම් සහ අභ්‍යන්තර දුරකථන පහසුකම් සැපයීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.
- රත්මලාන කාර්යාලයේ අලුතින් ඉදිකරන ලද පරිපාලන ඒකකයේ ප්‍රතිසංස්කරණය කරන ලද ප්‍රදේශය සඳහා පරිගණක ජාල/අන්තර්ජාල පහසුකම් සහ අභ්‍යන්තර දුරකථන පහසුකම් ලබාදීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.
- මොබිටෙල් 4G සංඥා ආවරණය වැඩි දියුණු කිරීම සඳහා ඩාටන්ෆිල්ඩ් කාර්යාල පරිශ්‍රයේ විදුලි සංදේශ කණුවක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලදී.
- ඩාර්ටන්ෆිල්ඩ් හි අධ්‍යක්ෂ කාර්යාලයට අධි විභේදන නිරීක්ෂණ කැමරා පද්ධතිය අධීක්ෂණය කිරීමේ පහසුකම ලබා දෙන ලදී.
- ආයතනික නිල වෙබ් අඩවිය (www.rrisl.gov.lk) යාවත්කාලීන කිරීමේ කටයුතු වසර මුළුල්ලේම සිදු කරන ලදී.
- ප්‍රාදේශීය සරි ජාලය (LAN), අතථ්‍ය ප්‍රාදේශීය සරි ජාලය (VLAN), දෘඪාංග ෆයර්වෝල් සහ විද්‍යුත් තැපැල් සේවාදායකය පරිපාලනය කිරීමේ කටයුතු වසර මුළුල්ලේම සිදු කරන ලදී.
- පරිගණක සහ පර්යන්ත, ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ, ඇඟිලි සලකුණු යන්ත්‍ර, දුරකථන පද්ධති සහ අධි විභේදන නිරීක්ෂණ කැමරා පද්ධතිය නඩත්තු කිරීම වසර පුරා සිදු කරන ලදී.
- ඩාර්ටන්ෆිල්ඩ් කාර්යාල පරිශ්‍රයේ ස්ථාපිත ඩයලොග් විදුලි සංදේශ කුළුණ භාවිතයෙන් ඩයලොග් 4G සහ 2G සංඥා ආවරණය වැඩිදියුණු කිරීමට මූලික පියවර ගන්නා ලදී.
- ඩාර්ටන්ෆිල්ඩ් කාර්යාලයේ අන්තර්ජාල සම්බන්ධතාවය වඩාත් ස්ථාවර, බාධා වලින් තොර සහ අධිවේගී අන්තර්ජාල දත්ත වේගයක් සහිත දෘශ්‍ය තන්තු ලීස් ලයින් සම්බන්ධතාවයක් හරහා වැඩිදියුණු කිරීමට ශ්‍රී ලංකා ටෙලිකොම් සමඟ මූලික පියවර ගන්නා ලදී.
- මොබිටෙල් 4G රැහැන් රහිත රවුටරය හෝ ප්‍රකාශ තන්තු (ෆයිබර් ඔප්ටික්) හරහා නිවිතිගල කැලේ උප මධ්‍යස්ථානයේ අන්තර්ජාල පහසුකම වැඩිදියුණු කර ගැනීමට SLT Mobitel සමඟ මූලික කටයුතු සිදු කරන ලදී.

රබර් තාක්ෂණ දෙපාර්තමේන්තු

රබර් තාක්ෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව

- රබර් කර්මාන්තයේ ඉල්ලීම මත සෝල් ක්‍රේප් (sole crepe) සාම්පල 94 ක්, රබර් සංයෝග 118 ක් සහ රබර්/පොලිතීන් නිෂ්පාදන 504 ක් පරීක්ෂා කරන ලදී.
- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්/කුඩා රබර් වතු හිමියන් 18 දෙනෙකු සහ විශ්වවිද්‍යාල සිසුන් කණ්ඩායම් තුනක්, ස්වභාවික රබර් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය පිළිබඳව පුහුණු කරන ලදී.

- රබර් තාක්ෂණික හා සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද රබර් භාණ්ඩ නිෂ්පාදනය පිළිබඳ වැඩමුළු හතරක් සඳහා සම්පත් දායකත්වය ලබා දෙන ලදී.
- ගාල්ල ලබුදුව ප්‍රදේශයේ පැවති "රිදී අබිසස්" ප්‍රදර්ශනය සඳහා කාර්ය මණ්ඩලය ක්‍රියාකාරීව සම්බන්ධ විය.

බහු අවයවික රසායනික දෙපාර්තමේන්තුව

- සල්ෆර් අඩංගු, ස්භාවික රබර් සංයෝග සඳහා උචිත, සෞඛ්‍යයට අහිතකර නයිට්‍රොසාඇමීන යන රසායනික විමෝචනය නොවන නව ද්විත්ව ත්වාරක අඩංගු පද්ධති වල බලපෑම අධ්‍යයනය කරන ලදි.
- රබර් කිරි වලට අගය බද්ධ කිරීමේ ප්‍රයත්නයක් ලෙස ස්වාස්ථීත පිරවුම්කාරකයක් අන්තර්ගත කිරිම් නව ක්‍රමවේදයක් අධ්‍යයනය කරන ලදි.
- අධිතාක්ෂණික උපකරණ (FTIR, TGA, DSC හා DMA) භාවිතයන් රබර් සංයෝග සහ ඒවාගේ සංයුතිය තීරණය කිරීමට අදාල විශ්ලේෂණාත්මක වාර්තා දහසකට අධික ප්‍රමාණයක් විවිධ රබර් ආශ්‍රිත කර්මාන්තකරුවන්, විශ්වවිද්‍යාල සිසුන් හා අනෙකුත් පර්යේෂණ ආයතන සඳහා ලබා දෙන ලදි.

දළ රබර් හා රසායන විශ්ලේෂණ දෙපාර්තමේන්තුව

- දළ රබර් හා රසායනික විශ්ලේෂණ දෙපාර්තමේන්තුව මඟින් දළ රබර් නිෂ්පාදකයින්ට, රබර් අපනයනකරුවන්ට සහ කුඩා හා මධ්‍යම ප්‍රමාණ රබර් ක්ෂේත්‍රයේ ව්‍යවසායකයින්ට අන්තර් ජාතිකව පිළිගත් විශ්ලේෂණ සහතිකපත් නිකුත් කරනු ලැබේ.
- මෙම දෙපාර්තමේන්තුව මඟින් දළ රබර් හා රබර් නිෂ්පාදනයට යොදාගන්නා ද්‍රව්‍ය සඳහා විශ්ලේෂණාත්මක පරීක්ෂණ පහසුකම් සහතික කිරීමේ සේවාව රබර් ක්ෂේත්‍රයේ සියළුම අංශ සඳහා සපයනු ලැබේ.
- මෙම වසර සඳහා වියළි රබර් සාම්පල 257, රබර් කිරි සාම්පල 1161 සහ රබර් නිෂ්පාදනයට යොදාගන්නා රසායනික ද්‍රව්‍ය සාම්පල 26 ඇතුළුව සාම්පල 1444 සඳහා තත්ව සහතික නිකුත්කොට ඇත.
- මෙම වසර සඳහා රබර් නිපැයුම් කරුවන්ගේ තත්ව වාර්තා සහ වෙළෙඳපොල අවශ්‍යතා සඳහා තත්ව සහතික 512 ක් නිකුත්කොට ඇත.
- නවතම රබර් ක්ලෝන 13 සඳහා එම රබර් කිරිවල ගුණාංග හා එමඟින් නිපදවන වියළි රබර්වල ගුණාංග අධ්‍යයනය කොට ඇත. තවද රුහුණු විශ්වවිද්‍යාලය සමඟ කසල රබර් මඟින් ලබාගන්නා (Pyr) කාබන් පිරිපහදු කොට නැවත නිෂ්පාදනයට යොදා ගැනීමේ හැකියාව බැලීම සඳහා සහයෝගී ව්‍යාපෘතියක් කරන ලදි.
- විශ්වවිද්‍යාල සිසුන් සඳහා වියළි රබර් හා රබර් කිරි විශ්ලේෂන පිළිබඳ පුහුණු වැඩසටහන් 2 ක් පවත්වන ලදි. රබර් කර්මාන්තකරුවන්ගේ ගැටළු නිරාකරණය කිරීම සඳහා කර්මාන්තශාලා 3 ක් සඳහා සහයවන ලදි.

දළ රබර් සැකසුම් සංවර්ධන හා රසායනික ඉංජිනේරු දෙපාර්තමේන්තුව

- අගය එකතු කරන ලද ස්වභාවික රබර් කිරි කාණ්ඩයක් ලෙස අඩු ප්‍රෝටීන සංයුතියක් සහිත කේන්ද්‍රාපසාරී ස්වභාවික රබර් කිරි නිෂ්පාදනය කිරීම සඳහා නව දෙමුහුම් තාක්ෂණ ක්‍රමවේදයක් අත්හදාබැලීම.
- අගය එකතු කරන ලද ස්වභාවික වියලි රබර් කාණ්ඩයක් ලෙස ප්‍රෝටීන ප්‍රමාණය අඩු කරන ලද ක්‍රේප් රබර් නිෂ්පාදනය සඳහා එන්සයිමයක් භාවිතයෙන් නව නිෂ්පාදන ක්‍රියාවලියක් වැඩිදියුණු කිරීම. එම ක්‍රේප් රබර් වල දල රබර් ගතිගුණ, භෞතික-යාන්ත්‍රික ගතිගුණ හා ගතික ගතිගුණ පරීක්ෂා කිරීම.
- දැනට පවතින ස්වායු හා නිර්වායු ඒකාබද්ධ ජල පිරිපහදු පද්ධතිය වැඩිදියුණු කිරීම මගින් කුඩා පරිමාණ රබර් නිෂ්පාදන අංශය සඳහා වඩා ලාභදායී අපජලය පිරිපහදු පද්ධතියක් හදුන්වාදීම සඳහා අධ්‍යනයක් ආරම්භ කිරීම.
- ශක්තිමත් සහ බරින් අඩු, ආවෘත කුටීරමය ව්‍යුහයක් සහිත ස්වභාවික රබර් නිපදවීම සඳහා ශක්තිය ලබා දෙන පිරවුම් කාරකයක් ලෙස බහු බිත්ති කාබන් නැනෝ නාල යොදාගැනීමේ විභවතාවය පරීක්ෂා කිරීම සඳහා පර්යේෂණයක් සිදු කිරීම.
- කෙන්ද්‍රාපසරණය කරන ලද රබර් කිරි වෙනුවට ක්‍රීම් කරන ලද රබර් කිරි භාවිත කිරීම පිළිබඳ අධ්‍යනයක් සිදු කරන ලද අතර තෝරාගත් නිෂ්පාදන වර්ග සඳහා ක්‍රීම් කරන ලද රබර් කිරි ද භාවිත කිරීමට හැකි බව සොයා ගන්නා ලදී.
- රබර් කිරි ආශ්‍රිත නිෂ්පාදන ක්‍රියාවලියන්හිදී වැය වන වියදම, ශක්තිය හා කාලය අවම කිරීමට තුනී පටල සහිත රබර් නිෂ්පාදන සඳහා නව වල්කනයිසිකරණ ක්‍රමවේදයක් වැඩිදියුණු කිරීමට අධ්‍යනයක් සිදුකිරීම. සම්ප්‍රදායික රබර් කිරි සංයෝග මිශ්‍රණය වෙනුවට සල්ෆර්, උත්ප්‍රේරක හා සක්‍රියකාරක යන වල්කනයිසිකරණ අමුද්‍රව්‍ය අඩංගු ද්‍රව සංයෝග මිශ්‍රණයක් සුදුසු තත්වයන් වලදී භාවිතා කරන ලදී.
- RubSys - ස්වභාවික රබර් වගාකරුවන් හා නිෂ්පාදකයින් අතර තොරතුරු හා දැනුම බෙදාහැරීම සඳහා යෙදවුම් මෘදුකාංගයක් නිපදවීම.

ඩාර්ටන්ෆීල්ඩ් වතු සමූහය

- තක්සේරු කරන ලද බෝග අස්වැන්නෙන් 84% ක් ලබාදෙමින් කිලෝග්‍රෑම් 165,971 ක මුළු අස්වැන්නක් ලබාගැනීමට සමාලෝචිත වසර තුල දී හැකි විය. පසුගිය වසර හා සංසන්දනය කිරීමේදී බෝග අස්වැන්න 10% කින් වැඩි වී තිබුණි. නෙළන ලද මුළු අස්වැන්නෙන් 25% ක් වූ කිලෝග්‍රෑම් 41,024 ක ප්‍රමාණයක් වැසි සහිත දින වලදී වැසි ආවරණ පවත්වාගෙන යාම හේතුවෙන් ලබා ගත හැකි වී තිබුණි.
- මෙම වර්ෂයේ දී හෙක්ටයාරයකින් (Y.P.H) කිලෝග්‍රෑම් 912 ක සාමාන්‍ය අස්වැන්නක් ලබාගැනීමට හැකියාව ලැබුණු අතර පසුගිය වසරට සාපේක්ෂව හෙක්ටයාරයකින් ලබාගත් අස්වැන්න කිලෝග්‍රෑම් 67 කින් වැඩි වී තිබුණි.
- මෙම වසර තුළ රබර් ගස් 251 ක කිරි කැපීමේ කර්තව්‍ය තුළින් ලබා ගත් කිලෝග්‍රෑම් 8.0 ක රබර් කිරි ප්‍රමාණය කිරි අස්වනු සහයකයකුගේ කිරි එකතු කිරීමේ සාමාන්‍ය විය. හෙක්ටයාර 5.17 භූමි ප්‍රමාණයක සිටුවා ඇති 2010 ක්ෂේත්‍රයේ මෙම වර්ෂය තුළ, එතුල්

සහිතව දින හතරකට වරක් අර්ධ සර්පිලාකාර (S/2,D4) කිරි කැපුම් ක්‍රමය යටතේ ආර්.ආර්.අයි.එස්.එල් 203/2001 (RRISL 203/2001) ක්ලෝනයට අයත් ශාක 225 ක කිරි කැපීමෙන් කිරි අස්වනු සහයකයකු ලබාගත් ඉහළම කිරි අස්වැන්න වශයෙන් කිලෝග්‍රෑම් 12.7 ක කිරි අස්වැන්නක් වාර්තා වී තිබුණි.

- වසර තුළ වාර්තාගත වූ සාමාන්‍ය වශයෙන්, ප්‍රමාද වී, වැසි ආවරණ සහිතව කිරි කැපීම සිදු කල දින සංඛ්‍යාවන් සහ කිරි නොකැපූ මුළු දින ගණන අනුපිළිවෙලින් 217, 11, 85 හා 52 ක් විය.
- වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර් 3376.8 ක් වූ අතර, එය පෙර වර්ෂයට වඩා මිලිමීටර් 1012.9 ක අඩුවීමක් වන අතරම, මෙම වර්ෂයේ දී වැසි දින 177 ක් වාර්තා වූ අතර, එය පෙර වර්ෂයට වඩා දින 27 ක අඩු වීමක් ලෙසද දැක්විය හැකිය.
- මෙම වර්ෂයේ නිෂ්පාදන පිරිවැය (COP) සහ ශුද්ධ විකුණුම් සාමාන්‍යය (NSA) අනුපිළිවෙලින් කිලෝග්‍රෑම් 01 කට රු. 300.90 ක් හා රු. 333.73 ක් වූ අතර කිලෝග්‍රෑම් 01 කින් රු.32.83 ක ලාභයක් වාර්තා වූ අතර මුළු ලාභය රු.මිලියන 5.4 ක් විය. මෙම වසර සඳහා වාර්තාගත වූ ලාභය හෙක්ටයාර එකක් සඳහා රු. 29,943.55 ක් විය. 01 වන ශ්‍රේණිය යන තත්ත්ව මට්ටමින් නිෂ්පාදනය කළ ක්‍රේප් රබර් (Pale Crepe) ප්‍රමාණය රබර් අස්වැන්නෙන් 82% ක් විය.

කුරුවිට උප මධ්‍යස්ථානය

- කුරුවිට උප මධ්‍යස්ථානයේ පරිණත හා අපරිණත රබර් වගා කළ භූමි ප්‍රමාණ අනුපිළිවෙලින් හෙක්ටයාර 79.36 ක් හා 2.80 ක් විය.
- සමාලෝචිත වසර තුළ දී, කිලෝග්‍රෑම් 79,457 ක මුළු අස්වැන්නක් ලබා ගැනීමට හැකි වූ අතර, එය පසුගිය වසරේ රබර් කිරි අස්වැන්නට සාපේක්ෂව කිලෝග්‍රෑම් 7149 ක වැඩිවීමකි.
- මෙම වසරේ දී හෙක්ටයාරයකින් (Y.P.H) කිලෝග්‍රෑම් 1001.2 ක සාමාන්‍ය අස්වැන්නක් ලබාගැනීමට හැකියාව ලැබුණු අතර, මෙම වසර තුළ මෙම වතුයායේ කිරි අස්වනු සහයකයකුගේ කිරි එකතු කිරීමේ සාමාන්‍යය කිලෝග්‍රෑම් 7.4 ක් වූ අතර, පූර්ව වර්ෂයේ අගයට වඩා කිලෝග්‍රෑම් 0.1 ක වැඩි වීමක් දක්නට ලැබුණි.
- සමාලෝචිත වර්ෂය තුළ දී, සාමාන්‍ය, වැසි ආවරණ සහිත, වැස්සෙන් බාධා වූ හා කිරි නොකැපූ දින ගණන අනුපිළිවෙලින් 241, 96, 0 සහ 29 ක් විය.
- වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර් 3428.3 ක් වූ අතර, මෙම වර්ෂයේ දී වැසි දින 215 ක් වාර්තා විය. පෙර වසර තුල වර්ෂාපතනය මිලිමීටර් 3976.8 ක් වූ අතර, වැසි දින 226 ක් වාර්තා විය.
- මෙම වර්ෂයේ නිෂ්පාදන පිරිවැය (COP) සහ ශුද්ධ විකුණුම් සාමාන්‍යය (NSA) අනුපිළිවෙලින් කිලෝග්‍රෑම් 01 කට රු. 292.36 ක් හා රු. 311.69 ක් විය. එබැවින් මෙම වර්ෂයේ මුළු ලාභය රු.මිලියන 1.5 ක් හා වාර්තාගත වූ ලාභය හෙක්ටයාර එකක් සඳහා රු. 19,353.63 ක් විය.

පොල්ගහවෙල උප මධ්‍යස්ථානය

- සමාලෝචිත වසර තුළ තක්සේරු කරන ලද බෝග අස්වැන්නෙන් 82% ක් වූ කිලෝග්‍රෑම් 17,080 මුළු අස්වැන්නක් ලබාගැනීමට පොල්ගහවෙල උප මධ්‍යස්ථානයට හැකි විය. පසුගිය වසරේ දී ලබාගත් බෝග අස්වැන්නට සාපේක්ෂව බෝග අස්වැන්න 8.9% කින් වැඩි වී තිබුණි.
- මෙම වසර තුළ හෙක්ටයාරයකට අස්වනු සාමාන්‍ය (Y.P.H) කිලෝග්‍රෑම් 962 ක් විය.
- මෙම වසර තුළ, කිරි අස්වනු සහයකයකුගේ කිරි එකතු කිරීමේ සාමාන්‍ය කිලෝග්‍රෑම් 8.8 ක් විය. 2008 වගා ක්ෂේත්‍රය තුළ d4 කිරි කැපුම් ක්‍රම යටතේ ආර්ආර්අයිසී 121 (RRIC121) ක්ලෝනයට අයත් ශාක 269 ක කිරි කැපීමෙන් කිරි අස්වනු සහයකයකු ලබාගත් ඉහළම කිරි අස්වැන්න වශයෙන් කිලෝග්‍රෑම් 11.2 ක කිරි අස්වැන්නක් වාර්තාගත වී තිබුණි.
- සමාලෝචිත වර්ෂය තුළ දී, සාමාන්‍ය, වැස්සෙන් බාධා වූ හා කිරි නොකැපූ දින ගණන අනුපිළිවෙලින් 301,0 සහ 65 ක් විය.
- පසුගිය වර්ෂයේ වැසි දින 139 ක් සහිතව මුළු වර්ෂාපතනය මිලිමීටර් 2170.5 ක් වූ අතර, එයට සාපේක්ෂව සමාලෝචිත වසර තුළ වැසි දින 118 ක් සහිතව වාර්තා වූ මුළු වර්ෂාපතනය මිලිමීටර් 2385.5 ක් විය.
- නිෂ්පාදනය කළ මුළු දුම් ගැසූ දාර රබර් (RSS) ප්‍රමාණයෙන් 01 වන ශ්‍රේණිය යන තත්ත්ව මට්ටමින් නිෂ්පාදනය කළ දුම් ගැසූ දාර රබර් (RSS) ප්‍රමාණය 86% ක් විය.

මොණරාගල උප මධ්‍යස්ථානය

- පර්යේෂණ වැඩකටයුතු දිගටම සිදු කරගෙන යාම, අප ආයතනයේ ක්ෂේත්‍රයන්හි බෝග වගාවන් ලෙස, මුංඇට, අමු මිරිස්, කව්පි, බණ්ඩක්කා, වම්බටු, මඤ්ඤොක්කා වැනි බෝග වගා කිරීම.
- 2020 වර්ෂයේ තවත් හෙක්ටයාර් 02 ක ප්‍රමාණයක රබර් කිරි කැපීම ආරම්භ කිරීම සිදු කරන ලද අතර මේවන විට සම්පූර්ණ හෙක්ටයාර් 05 ක රබර් කිරි කැපීම සිදු කරන අතර, රබර් කිරි කිලෝග්‍රෑම් 3687 ලබා දුන් අතර ආදායම රු.1,022,830/= වේ.
- අප ආයතනය මගින් උපදෙස් ලබා ගැනීමට සහ රබර් වගාව සඳහා දැනුම ලබා ගැනීමට කුඩා රබර් වතු හිමියන් 189 දෙනෙකු පැමිණ ඇති අතර සංවර්ධන වැඩකටයුතු ලෙස ආයතනයේ ඉදිවෙමින් පවතින තාක්ෂණ උද්‍යානයේ වැඩ කටයුතු සිදු කිරීම දිගටම සිදු කරගෙන යාම 2015 වර්ෂය තුල ආරම්භ කරන ලද ග්ලිරිසීඩියා (5000) වගාවේ නඩත්තු කටයුතු දිගටම සිදු කරගෙන යන ලදි.

ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලය

කළමනාකරණ මණ්ඩලය

ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් පත් කරන ලද සාමාජිකයෝ

1. මහාචාර්ය සුධීරා එම්.ඩබ්. රන්වල මිය, සභාපතිනි, ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලය
2. කේ.වී.ඩී.සී. විමලසිරි මයා, අධ්‍යක්ෂ (සංවර්ධන), වැවිලි අමාත්‍යාංශය
3. දර්ශනී ද සිල්වා මිය, අධ්‍යක්ෂ, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය
4. ආචාර්ය එල්.එම්.කේ. තිලකරත්න මයා, කොළඹ රබර් වෙළඳුන්ගේ සංගමයේ නියෝජිත
5. අනූෂ පෙරේරා මයා, වැවිලි උපදේශක, බලංගොඩ වැවිලි සමාගම
6. ජස්ටින් සෙනෙවිරත්න මයා, අධ්‍යක්ෂ, ලලාන් රබර් පුද්ගලික සමාගම
7. උදාර ප්‍රේමතිලක මයා, අධ්‍යක්ෂ වැවිලි (රබර්), කැළණි වැලි වැවිලි සමාගම
8. ආචාර්ය කාංචන සිල්වා මයා, අධ්‍යක්ෂ, තුරුසවිය අරමුදල
9. මහාචාර්ය ගාමිණී සේනානායක මයා, සභාපති, ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව

නිල බලයෙන් පත් වූ සාමාජිකයෝ

1. ජේ.එම්. මංගලතිස්ස මයා, අධ්‍යක්ෂ ජනරාල්, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
2. එස්.එස්. පෙහොලියැද්ද මයා, සභාපති, ලංකා වැවිලිකරුවන්ගේ සංගමය (2020.08.21 දින දක්වා)
3. භාතිය බුළුමුල්ල මයා, සභාපති, ලංකා වැවිලිකරුවන්ගේ සංගමය (2020.10.16 දින සිට)

ස්ථාවර කමිටුව

වතු කමිටුව

1. මහාචාර්ය සුධීරා එම්.ඩබ්. රන්වල මිය, සභාපතිනි, ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලය (කමිටු සභාපති) (2020.01.30 දින සිට)
2. ආචාර්ය වී.එච්.එල්. රුද්‍රිගෝ මයා, අතිරේක අධ්‍යක්ෂ, රබර් පර්යේෂණායතනය
3. ආචාර්ය ප්‍රියානි සෙනෙවිරත්න මිය, නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ (ජීව), රබර් පර්යේෂණායතනය
4. ආචාර්ය සුසන්ත සිරිවර්ධන මයා, නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ (තාක්ෂණික), රබර් පර්යේෂණායතනය
5. නිස්සංක සෙනෙවිරත්න මයා, අධ්‍යක්ෂ, කොටගල වැවිලි සමාගම (නම්කල සාමාජික)
6. ජගත් හෙට්ටිආරච්චි මයා, ජ්‍යෙෂ්ඨ කළමනාකරු, පයාගල වත්ත (නම්කල සාමාජික)

7. චමින්ද ජයලත් මයා, කළමනාකරු, පුස්සැල්ලාව වත්ත (නම්කල සාමාජික) (2020.09.14 දින සිට)
8. පී.ඒ. ලක්ෂ්මන් මයා, ජ්‍යෙෂ්ඨ වතු කළමනාකරු, රබර් පර්යේෂණායතනය
9. බී.එස්.එස්. හේවගේ මයා, ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී, රබර් පර්යේෂණායතනය
10. වතු කළමනාකරු, රබර් පර්යේෂණායතනය (කුරුවිට උප මධ්‍යස්ථානය සඳහා)

විගණන හා කළමනාකරණ කමිටුව

1. දර්ශනී ද සිල්වා මිය, අධ්‍යක්ෂ, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය (කමිටු සභාපති)
2. කේ.වී.ඩී.සී. විමලසිරි මයා, අධ්‍යක්ෂ (සංවර්ධන), වැවිලි අමාත්‍යාංශය
3. ජේ.එම්. මංගලතිස්ස මයා, අධ්‍යක්ෂ ජනරාල්, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
4. නිලානි ජයසිරි මිය, විගණන අධිකාරී, විගණකාධිපති දෙපාර්තමේන්තුව

සහභාගිත්වයෙන්

1. ආචාර්ය වී.එච්.එල්. රුදිගෝ මයා, අතිරේක අධ්‍යක්ෂ, රබර් පර්යේෂණායතනය
2. බී.එස්.එස්. හේවගේ මයා, ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී, රබර් පර්යේෂණායතනය
3. එම්.එස්.අයි. සේනාධීර මිය, අභ්‍යන්තර විගණක, රබර් පර්යේෂණායතනය
4. සුසන්ත දිසානායක මයා, ජ්‍යෙෂ්ඨ පරිපාලන නිළධාරී, රබර් පර්යේෂණායතනය

විද්‍යාත්මක කමිටුව

<u>ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයේ සාමාජිකයන්</u>

1. මහාචාර්ය සුධීරා රංවල මහත්මිය, සභාපතිනි, ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලය.
2. ආචාර්ය වී.එච්.එල්. රොදිගු මහතා, අතිරේක අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය.
3. ආචාර්ය ජී.පී.ඩබ්ලිව්.පී. සෙනෙවිරත්න මහත්මිය, නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ (ජීව විද්‍යා), ර.ප.ආ.
4. ආචාර්ය එස්. සිරිවර්ධන මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ (තාක්ෂණ), ර.ප.ආ.
5. ආචාර්ය ඩී.එම්.ඒ.පී. දිසානායක මහතා, ප්‍රධානී, උපදේශක සේවා දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
6. ආචාර්ය ඩී.ජී. එදිරිසිංහ මිය, ප්‍රධානී, රබර් තාක්ෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
7. ආචාර්ය එස්.පී. විතානගේ මිය, ප්‍රධානි, ප්‍රවේණි විද්‍යා හා ශාක අභිජනන දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
8. ආචාර්ය බී.ඩබ්. විජේසුරිය මිය, ප්‍රධාන පර්යේෂණ නිලධාරී, ජෛවමිතික අංශය, ර.ප.ආ.
9. ආචාර්ය එන්.එම්.සී. නයනකාන්ත මහතා, ප්‍රධානී, ශාක විද්‍යා දෙපාර්තමේන්තුව, ර.ප.ආ
10. ආචාර්ය ටී.එච්.පී.එස්. ප්‍රනාන්දු මිය, ප්‍රධානී, ශාක ව්‍යාධිවේද හා ක්ෂුද්‍රජීවී විද්‍යා දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
11. ආචාර්ය ඊ.එස්. මුණසිංහ මිය, පර්යේෂණ නිලධාරී, උපයෝගීතා පර්යේෂණ ඒකකය, ර.ප.ආ.
12. ආචාර්ය කේ.වී.වී.එස්. කුඩලිගම මිය, ප්‍රධාන පර්යේෂණ නිලධාරී, ජෛව රසායන හා කායික විද්‍යා දෙපාර්තමේන්තුව, ර.ප.ආ.

13. ආචාර්ය ආර්.පී. හෙට්ටිආරච්චි මිය, ප්‍රධාන පර්යේෂණ නිලධාරී, පාංශු හා ශාක පෝෂ්‍යත්ව දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
14. ආචාර්ය ඒ.පී. අත්තනායක මිය, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී, දළ රබර් සහ රසායනික විශ්ලේෂණ දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
15. ආචාර්ය කේ.කේ. ලියනගේ මහතා, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී, ප්‍රවේණි විද්‍යා හා ශාක අභිජනන දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
16. ටී.යූ.කේ. සිල්වා මහතා, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී, ශාක විද්‍යා දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
17. බී.එම්.ඩී.සී. බාලසූරිය මිය, පර්යේෂණ නිලධාරී, උපයෝගිතා පර්යේෂණ ඒකකය, ර.ප.ආ
18. ඩී.එස්.ඒ. නාකන්දල මිය, පර්යේෂණ නිලධාරී, ශාක විද්‍යා දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
19. එම්.කේ.ආර්. සිල්වා මිය, පර්යේෂණ නිලධාරී, ශාක ව්‍යාධිවේද හා ක්ෂුද්‍රජීව විද්‍යා දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
20. පී.වී.ඒ. අනුෂ්කා මිය, පර්යේෂණ නිලධාරී, ප්‍රවේණි හා ශාක අභිජනන දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
21. ඩබ්.ඩී.එම්. සම්පත් මහතා, පර්යේෂණ නිලධාරී, රබර් තාක්ෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
22. පී.කේ.කේ.එස්. ගුණරත්න මහතා, උපදේශක නිලධාරී, උපදේශක සේවා දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
23. ජේ.කේ.එස්. සංකල්ප මහතා, පර්යේෂණ නිලධාරී, කෘෂි ආර්ථික ඒකකය, ර.ප.ආ.
24. කේ. අධිකාරි මහතා, පර්යේෂණ නිලධාරී, දළ රබර් සහ රසායනික විශ්ලේෂණ දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
25. අයි.එච්.කේ. සමරසිංහ මිය, පර්යේෂණ නිලධාරී, බහු අවයවික රසායන දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
26. ටී.ටී.ඩී. දහනායක මිය, පර්යේෂණ නිලධාරී, ප්‍රවේණි හා ශාක අභිජනන දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
27. එච්.ඒ. රුවනි ජයවර්ධන මිය, පර්යේෂණ නිලධාරී, පාංශු හා ශාක පෝෂක දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
28. එන්.පී. සුරනි කරුණාරත්න මිය, පර්යේෂණ නිලධාරී, ජෛව රසායන හා කායික විද්‍යා දෙපාර්තමේන්තුව, ර.ප.ආ
29. පී.ජී.ඒන්. ඉෂානි මිය, පර්යේෂණ නිලධාරී, කෘෂි ආර්ථික ඒකකය, ර.ප.ආ.
30. යශෝධ සෝමරත්න මහතා, පර්යේෂණ නිලධාරී, බහු අවයවික දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
31. වයි.සී.වයි. සුදුසිංහ මහතා, පර්යේෂණ නිලධාරී, දළ රබර් සැකසුම් සංවර්ධන හා රසායනික ඉංජිනේරු දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
32. පී.ඒ. ලක්ෂ්මන් මහතා, ජ්‍යෙෂ්ඨ කළමණාකරු (වතු), ර.ප.ආ.

<u>රබර් කර්මාන්තය සහ අනෙකුත් ආයතන නියෝජනය කරන සාමාජිකයෝ</u>

1. කේ.වී.ඩී.සී. විමලසිරි මහතා, අධ්‍යක්ෂ (සංවර්ධන), වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය.
2. ඩබ්.කේ. චතුරංගි මිය, සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන), වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය.

3. දෙවිමිත් රෝහණ මහතා, අධ්‍යක්ෂ (සංවර්ධන), ර.සං.දෙ, නො. 465, ගනහේන, බත්තරමුල්ල.
4. ආචාර්ය කේ. ද සිල්වා මිය, තුරුසවිය අරමුදල, නො 74, කඩුවෙල පාර, බත්තරමුල්ල
5. ආචාර්ය පී. ධර්මසේන මහතා, ජාතික වැවිලි කළමණාකරණ ආයතනය, එම්.ඩී.එච් ජයවර්ධන මාවත, අතුරුගිරිය.
6. මනෝජ් උඩුගම්පොළ මහතා, ප්‍රධාන විධායක නිලධාරි, අගලවත්ත වැවිලි සමාගම, FLC Tower, නො 19, ඩඩ්ලි සේනානායක මාවත, කොළඹ 08.
7. ඒ.සී. බර්ටස් මහතා, සාමාන්‍යාධිකාරි, අගලවත්ත වැවිලි සමාගම, FLC Tower, නො 19, ඩඩ්ලි සේනානායක මාවත, කොළඹ 08.
8. එස්. දිසානායක මහතා, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි, අගලවත්ත වැවිලි සමාගම, FLC Tower, නො 19, ඩඩ්ලි සේනානායක මාවත, කොළඹ 08.
9. එල්.එච්.එස්. චමින්ද මහතා, අධිකාරි, අගලවත්ත වැවිලි සමාගම, පීන්කන්ද වතුයාය, නිවිතිගල.
10. කේ.එම්.එස්. විජේරත්න මහතා, අධිකාරි, අගලවත්ත වැවිලි සමාගම, තිරිවානාකැටිය වතුයාය, මහගම.
11. කේ. ප්‍රනාන්දු මහතා, අධිකාරි, අගලවත්ත වැවිලි සමාගම, ක්ලොඩන් වතුයාය, නෑබොඩ.
12. ඩී. වැකුණගොඩ මහතා, අධිකාරි, අගලවත්ත වැවිලි සමාගම, දෙලොස්වල වතුයාය, නිවිතිගල.
13. ආර්.ඒ.ඩී.අයි. රාමනායක මහතා, අධිකාරි, අගලවත්ත වැවිලි සමාගම, වටාපොත වතුයාය, නිවිතිගල.
14. ඩී.පී.ඒ. පෙරේරා මහතා, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි, තැ.පෙ 06 , බලංගොඩ වැවිලි සමාගම, පාම්ගාර්ඩන්, රත්නපුර.
15. ඩී.කේ. විජේරත්න මහතා, අධිකාරි, බලංගොඩ වැවිලි සමාගම, රඹුක්කන්ද වතුයාය, රත්නපුර.
16. බී.එල්.එල්. ප්‍රේමතිලක මහතා, අධිකාරි, බලංගොඩ වැවිලි සමාගම, මහාවල වතුයාය, රත්නපුර.
17. ආර්.ඒ. අලහකෝන් මහතා, අධිකාරි, බලංගොඩ වැවිලි සමාගම, ගලතුර වතුයාය, කිරිඇල්ල.
18. බී. බුළුමුල්ල මහතා, ප්‍රධාන විධායක නිලධාරී, ඇල්පිටිය වැවිලි සමාගම, 09 වන මහල, එයිටිකන් ස්පෙන්ස් 1 කුළුණ, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.
19. ඒ.ජී. ගීත් කුමාර මහතා, සාමාන්‍යාධිකාරි, ඇල්පිටිය වැවිලි සමාගම, ඇල්පිටිය වතුයාය, තල්ගස්වල.
20. එරන්ද මහතා, සහකාර කළමණාකරු, ඇල්පිටිය වැවිලි සමාගම, තල්ගස්වල වතුයාය, තල්ගස්වල.
21. චානක විමලසේන මහතා, සහකාර කළමණාකරු, ඇල්පිටිය වැවිලි සමාගම, බෙන්තොට වතුයාය, ඇල්පිටිය.

22. ආර්.බී.එස්. ඩග්ලස් මහතා, ජ්‍යෙෂ්ඨ කළමණාකරු, ඇල්පිටිය වැවිලි සමාගම, ඇල්පිටිය වතුයාය, ඇල්පිටිය.
23. එන්.එම්.එස්.බී. නවරත්න මහතා, කළමණාකරු, ඇල්පිටිය වැවිලි සමාගම, ගුලුගහකන්ද වතුයාය, වදුරඹ.
24. යූ.ඒ.කේ. කරුණානායක මහතා, කළමණාකරු, ඇල්පිටිය වැවිලි සමාගම, දිවිතුර වතුයාය, ඇත්කඳුර.
25. දසුන් වේරසිංහ මහතා, ජ්‍යෙෂ්ඨ සහකාර කළමණාකරු, ඇල්පිටිය වැවිලි සමාගම, දිවිතුර වතුයාය, ඇත්කඳුර.
26. එල්.එම්. අමරතුංග මහතා, අධිකාරි, පුස්සැල්ලාව වැවිලි සමාගම, සාලාව වතුයාය.
27. එස්.ඒ. ඊරියගම මහතා, ප්‍රධාන විධායක නිලධාරී, කෑගල්ල වැවිලි සමාගම, 310 හයිලෙවල් පාර නාවින්න, මහරගම.
28. එස්.ඒ.ඒ.සී. ජයතිලක මහතා, අධිකාරි, කෑගල්ල වැවිලි සමාගම, පල්ලේගම වතුයාය, නියඳුරුපොළ.
29. එස්.ඩී. මුණසිංහ මහතා, අධිකාරි, කෑගල්ල වැවිලි සමාගම, ඉදැල්ල වතුයාය, පොල්ගහවෙල.
30. බී.එම්.ජේ.ඒ. මුනමලේ මහතා, අධිකාරි, කෑගල්ල වැවිලි සමාගම, අටාලේ වතුයාය, අටාලේ.
31. එච්. මැදිවක මහතා, අධිකාරි, හපුගස්තැන්න වැවිලි සමාගම, බිබිලේ වතුයාය, බිබිලේ.
32. සංජීව මහතා, නියෝජ්‍ය කළමණාකරු, හොරණ වැවිලි සමාගම, හිල්ස්ට්‍රීම් වතුයාය, බුලත්සිංහල.
33. එම්. කාරියප්පෙරුම මහතා, අධ්‍යක්ෂ, හොරණ වැවිලි සමාගම, නො.400, ඩින්ස් පාර, කොළඹ 10.
34. ගාමිණි එන් රත්නායක මහතා, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි, හොරණ වැවිලි සමාගම, නිව්වැටල් වතුයාය, නෑබොඩ.
35. එන්. විජේනායක මහතා, කළමණාකරු, හොරණ වැවිලි සමාගම, හල්වතුර වතුයාය, ඉංගිරිය.
36. සජිත් ගුණවර්ධන මහතා, කළමණාකරු, හොරණ වැවිලි සමාගම, ප්‍රොසෙස්ටර් වතුයාය, ගෝවින්න.
37. එන්.බී. සෙනෙවිරත්න මහතා, අධ්‍යක්ෂ, පහතරට, කොටගල වැවිලි සමාගම, ප්‍රාදේශීය කාර්යාලය, කොළඹ 01.
38. ජේ.එන්. සෙනෙවිරත්න මහතා, ජ්‍යෙෂ්ඨ කළමණාකරු, කොටගල වැවිලි සමාගම, පයියාගල වතුයාය, දොඩන්ගොඩ.
39. එල්.ඒ.ඩී.ජේ. පෙරේරා මහතා. ජ්‍යෙෂ්ඨ කළමණාකරු, කොටගල වැවිලි සමාගම, ඩෙල්කිත් වතුයාය, බදුරලිය.
40. ආර්. තෙන්නකෝන් මහතා, ජ්‍යෙෂ්ඨ කළමනාකරු, කොටගල වැවිලි සමාගම, පාදුක්ක වතුයාය, පාදුක්ක.

41. ප්‍රියන්ත රත්නායක මහතා, කළමණාකරු, කොටගල වැවිලි සමාගම, ගීකියනකන්ද වතුයාය, නෑබොඩ.
42. ජී.එල්.ටී. ස්වරජිත් මහතා, කළමණාකරු, කොටගල වැවිලි සමාගම, ඇදුරගල වතුයාය, ඉංගිරිය.
43. ඒ.එම්.ඒ.අයි. අබේසිංහ මහතා, කළමණාකරු, අරප්පලකන්ද වතුයාය, තෙබුවන.
44. යූ. අමරසේකර මහතා, නියෝජ්‍ය කළමණාකරු, කොටගල වැවිලි සමාගම, වෝගන් වතුයාය, මතුගම.
45. එන්. විජේරත්න මහතා, කළමණාකරු, කොටගල වැවිලි සමාගම, හැඩිගල්ල වතුයාය, බදුරලිය.
46. සී. අමරතුංග මහතා, ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී, කහවත්ත වැවිලි සමාගම, ප්‍රාදේශීය කාර්යාලය, පැල්මඩුල්ල වතුයාය, කහවත්ත.
47. එස්. හේවාගම මහතා, කහවත්ත වැවිලි සමාගම, හුණුවල වතුයාය, ඕපනායක.
48. වජිර හේවගේ මහතා, කළමණාකරු, කහවත්ත වැවිලි සමාගම, ඕපාත වතුයාය, කහවත්ත.
49. එල්. පෙරේරා මහතා, කහවත්ත වැවිලි සමාගම, පැල්මඩුල්ල වතුයාය, කහවත්ත.
50. මහේෂ් බණ්ඩාර මහතා, සහකාර කළමණාකරු, කහවත්ත වැවිලි සමාගම, පෝරණුව වතුයාය, කහවත්ත.
51. එම්.ආර්. ජයවංශ මහතා, සහකාර කළමණාකරු, කහවත්ත වැවිලි සමාගම, හවුපේ වතුයාය, කහවත්ත.
52. යූ. ප්‍රේමතිලක මහතා, අධ්‍යක්ෂ, කැළණිවැලි වැවිලි සමාගම, නො 400, ඩීන්ස් පාර, කොළඹ 10.
53. බී. ගුණසේකර මහතා, සාමාන්‍යාධිකාරී, කැළණිවැලි වැවිලි සමාගම, පනාවත්ත වතුයාය, යටියන්තොට.
54. ඩී. සරසිංහ මහතා, කළමණාකරු, කැළණිවැලි වැවිලි සමාගම, ඇදරුපොළ වතුයාය, බුලත්කොහුපිටිය.
55. ආර්.එල්. ඔබේසේකර මහතා, කැළණිවැලි වැවිලි සමාගම, කැළණි වතුයාය, යටියන්තොට.
56. පී.කේ.ඒ.එච්. තිලකරත්න මහතා, ජ්‍යෙෂ්ඨ කළමණාකරු, කැළණිවැලි වැවිලි සමාගම, වී -ඔය වතුයාය, යටියන්තොට.
57. ඩබ්.පී.එස්.බී. අබේවර්ධන මහතා, ජ්‍යෙෂ්ඨ කළමණාකරු, කැළණිවැලි වැවිලි සමාගම, දේවාලකන්ද වතුයාය, දෙහිඕවිට.
58. එම්. විජේදාස මහතා, සහකාර කළමණාකරු, කැළණිවැලි වැවිලි සමාගම.
59. පී ද එස්.ඒ. ගුණසේකර මහතා, සාමාන්‍යාධිකාරී, නමුණුකුල වැවිලි සමාගම, නො 310, හයිලෙවල් පාර, මහරගම.
60. ජේ.බී. වීරසේකර මහතා, අධිකාරී, නමුණුකුල වැවිලි සමාගම, පල්ලේගොඩ වතුයාය, දර්ගා නගරය.
61. ආර්. රණසිංහ මහතා. අධිකාරී, නමුණුකුල වැවිලි සමාගම, ඇලදුව වතුයාය, මතුගම.

62. කුෂාන් කරුණාතිලක මහතා, අධිකාරී, නමුණුකුල වැවිලි සමාගම, සීට්‍රස් වතුයාය, පාදුක්ක.
63. ජී.එස්.යූ. ද සිල්වා මහතා, අධිකාරී, නමුණුකුල වැවිලි සමාගම, මිරිස්වත්ත වතුයාය, වැලිපැන්න.
64. පී.පී.ඒ. පිරිස් මහතා, සාමාන්‍යාධිකාරී, 54, කිරුලපන මාවත, කොළඹ 06.
65. ඩී. අමරතුංග මහතා, සාමාන්‍යාධිකාරී, ලලාන් රබර් (පුද්) සමාගම, මල්වාන, බියගම.
66. එන්. සෙනෙවිරත්න මහතා, සමූහ සාමාන්‍යාධිකාරී, ලලාන් රබර් (පුද්) සමාගම, සපුමල්කන්ද වතුයාය, දැරණියගල.
67. ආර්. අලහකෝන් මහතා, සමූහ සාමාන්‍යාධිකාරී, උඩබාගේ වතුයාය, දැරණියගල.
68. අයි. වක්කුඹුර මහතා, කළමනාකරු, ලලාන් රබර් (පුද්) සමාගම, මහඔය වතුයාය, දෙහිඕවිට.
69. බී. මැදගම මහතා, අධිකාරී, මතුරට වැවිලි සමාගම, අඳපාන වතුයාය, කඹුරුපිටිය.
70. එල්.එම්.ඒ. බණ්ඩාර මහතා, අධිකාරී, මතුරට වැවිලි සමාගම, විල්පිට වතුයාය, අකුරැස්ස.
71. එම්.එච්.පී. ගුණරත්න මහතා, අධිකාරී, මතුරට වැවිලි සමාගම, දිද්දෙනිපොත වතුයාය, මාතර.
72. සී. ජයලත් මහතා, සහකාර සාමාන්‍යාධිකාරී, පුස්සැල්ලෑව වැවිලි සමාගම, පුස්සැල්ලෑව වතුයාය, පරකඩුව.
73. එල්.එම්. අමරතුංග මහතා, අධිකාරී, පුස්සැල්ලෑව වැවිලි සමාගම, සාලාව වතුයාය, හංවැල්ල.
74. ඩී. දාස්වත්ත මහතා, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, වටවල වැවිලි සමාගම, තලංගහ වතුයාය, නාකියාදෙණිය.
75. කිංස්ලි මහතා, නියෝජ්‍ය කළමණාකරු, වටවල වැවිලි සමාගම, නාකියාදෙණිය වතුයාය, නාකියාදෙණිය.
76. අසංග ඒකනායක මහතා, ජ්‍යෙෂ්ඨ සහකාර කළමණාකරු, වටවල වැවිලි සමාගම, හෝමදොල වතුයාය, උඩුගම.
77. සී. ප්‍රනාන්දු මහතා, විධායක අධ්‍යක්ෂ, මල්වත්ත වැවිලි සමාගම, නො. 280, වේල්ල වීදිය, කොළඹ 12.
78. ආර්.එම්.වයි. රත්නායක මහතා, සමූහ කළමණාකරු, මල්වත්ත වැලි වැවිලි සමාගම, මොරලිඔය වතුයාය, රුවන්වැල්ල.
79. ගයා නාකන්දල මහතා, උපදේශක, හෝකන්දර උතුර.
80. එස්. සෙනෙවිරත්න මහතා, සෙනෙවිරත්න සමූහ සමාගම, ඩී.ජේ. විජේවර්ධන මාවත, ගල්කිස්ස.
81. එන්.එම්. අමරසේකර මහතා, උපදේශක, 37/9, ටෙරන්ස් පටුමග, ගල්කිස්ස.
82. ජයන්ත පී. මුතුතන්ත්‍රී මහතා, උපදේශක, නො. 4/4, නෙළුම් මාවත, ගල්කිස්ස.

අර්ථ සාධක අරමුදල් කමිටුව

01. මහාචාර්ය සුධීරා රංවල මිය, සභාපතිනි, රබර් පර්යේෂණ මණ්ඩලය.
02. ආචාර්ය වී.එච්.එල්. රොද්‍රිගු මහතා, අතිරේක අධ්‍යක්ෂ, ර.ප.ආ. සාමාජික

03. ඩී.එම්.එස්. දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරී, ලේකම්
04. බී.එස්. හේවගේ මහතා, ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී, ර.ප.ආ., භාණ්ඩාගාරික
05. ටී.බී. දිසානායක මහතා, අත්හදා බැලීම් නිලධාරී, තේරී පත් වූ කමිටු සාමාජික
06. පී.කේ.කේ. එස් ගුණරත්න මහතා, උපදේශන නිලධාරී, තේරී පත් වූ කමිටු සාමාජික
07. ජෙ.ඒ.එස්. චන්ද්‍රසිරි මහතා, අත්හදා බැලීම් නිලධාරී, තේරී පත් වූ කමිටු සාමාජික

සභාපතිතුමාගේ කාර්යාලය සහ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් කාර්යාලය

සභාපතිනි - මහාචාර්ය සුධීරා එම්.ඩබ්. රන්වල මිය

වැ.බ. ලේකම් - පද්මා බාලසූරිය මිය, සභාපතිගේ පුද්ගලික සහකාර (2020.03.13 දින දක්වා) ජේ.ඒ.එච්. සන්ධ්‍යා මිය, ලඝුලේඛිකා (මණ්ඩලීය ලේකම් තනතුරෙහි රාජකාරී කටයුතු ආවරණය කිරීම) (2020.03.13 දින සිට)

කළමනාකරණ සහකාරවරුන් - එච්.එන්. කාංචනා මිය (2020.06.19 දින දක්වා)
එස්.එස්.ඩී.එස්.ආර්.ඩී.ඒ. විජේරත්න මෙනවිය (2020.06.23 දින සිට)

නීතීඥවරුන්
නීතිපති
නීතිපති දෙබාර්තමේන්තුව
(රජයේ ආයතන)
තැ.පෙ. 502
කොළඹ 12

බැංකුකරුවන්
ලංකා බැංකුව
කෝපරේට් ශාඛාව
75, ජනාධිපති මාවත
කොළඹ 01

විගණකවරුන්
විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
අංක 306/72, පොල්දූව පාර
බත්තරමුල්ල

ලංකා බැංකුව
අංක 306/72
අගලවත්ත

ඇමතුම් විස්තර

